FM 104.4,105.7

ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව

"රංගිරි ශ්‍රී ලංකා"

සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු


# රංගිරි ශ්‍රී ලංකා

## RANGIRI SRI LANKA NEWSPAPER




FM 104.4,105.7

ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව

"රංගිරි ශ්‍රී ලංකා"

සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු



ශ්‍රී.බු.ව. 2563- ක්‍රි.ව. 2020
මාර්තු (මැදින්)

මාසික බෞද්ධ සාර සංග්‍රහය - අන්තර්ජාල කලාපය

16





සිහගිරි තුරු මතින් ළා
හිරු කිරණ විදා
රන්වන් දඹුල සෑ මළුවම
කරයි උදා
පින්දම් කරන දෙස් දෙස්
දන මලින් පුදා
රන්ගිරි වෙහෙර නමදිති
බැති සිතින් සදා

### ඇතුළු පිටු....


- මැදින් පොහොය වර්ණාව හා පුදබිමක අසිරිය
- මැදින් පොහෝදා සිදු වූ අසිරිමත් චාරිකාව
- විශ්මිත ගුණ ඇති රංදෙණේ ගාථා
- බුදු දහමේ ඉගැන්වෙන දානය ගැන දැනගනිමු සත්පුරුෂ දාන අට
- සිංහල වනිතාව සතු නිදහස
- සුරස අතිරේකය



රංගිරි ශ්‍රී ලංකා රූපවාහිනිය

රංගිරි ශ්‍රී ලංකා
RSL TELEVISION

UHF CH 60
PEO TV CH 22
Dialog Tv 21
Dish Tv 2532

රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලිය
දේශයේ රන් හඬ

රංගිරි ශ්‍රී ලංකා
RSL RADIO

FM 104.4 - 105.7

වෙබ් : www.rangirisrilanka.lk



රංගිරි දඹුල්ල සංවර්ධන පදනමේ ප්‍රකාශනයකි.




බුද්ධ චරිතයට සම්බන්ධ ඉතා වැදගත් සිදුවීම් කිහිපයක් සිදුවූ පොහොයක් ලෙස මැදින් පෝය හැඳින්විය හැකිය. පරටීවරියාවේ යෙදුනු බුදුරජාණන් වහන්සේ ගම්,නියම් ගම්හි ජනපද චාරිකාවෙහි යෙදෙමින් වැඩ වෙසෙනබව දැනගත් පියාණන්වූ සුද්ධෝදන රජතුමාට බුදුරජාණන් වහන්සේ දැක ගැනීමේ බලවත් ආශාවක් උපන්නේය. ඒ බව සමීපතම අමාත්‍යවරයෙකු වූ කළුදායිට දන්වා සිටියේය. තමාට පැවිදිවීමට අවසර ලබාදෙන්නේ නම් බුදුරජාණන් වහන්සේ කිඹුල්වත්පුරයට වැඩම කරවා දෙන බවට රජතුමාට පොරොන්දුවිය. රජතුමා කළුදායි ඇමතිවරයාට මහණවීමට අවසර ලබාදුන්නේය.පැවිදි වූ කළුදායි තෙරුන් වහන්සේ සුද්ධෝදන රජුගේ ඉල්ලීම ඉදිරිපත් කෙළේය. කිඹුල්වත්පුරයට වඩින්නට සුදුසු කාලය එළඹි බව වර්ණනාත්මකව කළුදායි තෙරුන් බුදුරජාණන් වහන්සේට සැලකර සිටියේය. ආරාධනාව පිළිගත් බුදුරජාණන් වහන්සේ විසිදහසක් පමණ භික්ෂූන් වහන්සේලා සමගින් කිඹුල්වත්පුරයට වැඩම කිරීම ආරම්භ කෙළේ මැදින් පොහෝදිනකය.

රජමාලිගාවට වැඩමකළ බුදුරජාණන් වහන්සේ එහිදී දන් වළඳ ශාක්‍යවංශිකයන්ට දහම් දෙසූ සේක. ශාක්‍යවංශික කුඩාළමුන් ලවා බුදුරජාණන් වහන්සේට වන්දනා කරවූහ. මෙම ක්‍රියාව දුටු බුදුරජාණන් වහන්සේ යමාමහපෙළහර පෑ සේක. මානය දුරුකළ සුද්ධෝදන රජතුමා බුදුරජාණන් වහන්සේට දොහොත් මුදුනේ තබා වැන්දහ. එය දුටු අනෙකුත් ශාක්‍ය වංශිකයෝ බුදුරජාණන් වහන්සේට වන්දනා කළහ. යශෝදරා දේවිය බුදුරජාණන් වහන්සේ වැඩ සිටි මාළිගාවට නොපැමිණියාය. මේ අවස්ථාවේ යශෝදරා දේවිය කෙරෙහි කලකිරුණු ඥාතීහු දෝෂාරෝපණ කිරීමට පටන්ගත්හ. සුද්ධෝදන රජතුමා යශෝදරා දේවියගේ ගුණ වර්ණනා කරන්නට විය. ඇය කෙරෙහි කරුණාව උපදවාගත් බුදුරජාණන් වහන්සේ ආනන්ද තෙරුන් වහන්සේ සමග යසෝදරා දේවිය සිටි මාලිගාවට වැඩමකර එහිදී යසෝදරා දේවිය ප්‍රධාන පිරිසට ''සඳ කිඳුරු '' ජාතකයෙන් දහම් දෙසූ සේක. යසෝදරා දේවිය ප්‍රධාන පිරිසට ධර්මාවබෝධය ලැබිණි. බුදුරජාණන් වහන්සේ කිඹුල්වත්පුරයට වැඩමකර සත් දිනකින් රාහුල කුමරුවාගේ පැවිද්ද සිදුවිය. එය සුද්ධෝදන රජුගේ සිතට සෝකයක් ඉපැදවීය.

මේ බව බුදුරජාණන් වහන්සේ දන්වා සිටි රජතුමා දෙමව්පියන්ගේ අවසරයක් නොමැති දරුවන් පැවිදි නොකරන ලෙසට ඉල්ලීමක් කළේය. දෙමව්පියන්ගේ අවසරයක් නොමැතිව දරුවන් පැවිදි නොකරන ලෙසට විනය ප්‍රඥප්තියක් පැනවූයේද මෙම පොහොය මූලික කරගෙනය.සුද්ධෝදන රජතුමාට '' මහාධර්මපාල ජාතකය'' දේශනා කෙළේද මෙම පොහොය ලැබූ කාල සීමාවෙහිය. ලංකාවාසී බෞද්ධ ජනතාවට මැදින් පොහොය ඉතා වැදගත් වන්නේ ඉහත සඳහන් සිදුවීම් මූලික කරගෙනය. ලක්දිව විහාරස්ථානවල ආමිස පූජා ප්‍රතිපත්ති පූජාවන්හි යෙදෙන සැදැහැවත් ජනයාගෙන් පිරී පවතී.

ඇම්.ඞී.විජයවර්ධන

පුදබිමක අසිරිය

# කන්දේගම කන්දලෙන් රජමහා විහාරය

පොළොන්නරු දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රදේශයට අයත් දම්මින්න ගමෙහි මෙම ඓතිහාසික විහාරය පිහිටා තිබේ. මෙම ස්ථානයෙන් හමුවී ඇති අභිලේඛන වලට අනුව 02වන සියවසේදී තරම් පැරණි බවක් මෙම ස්ථානයට හිමිවේ.මෙම විහාරස්ථානයෙන් හමුවී ඇති සෙල්ලිපිවල සද්ධාතිස්ස රජුගේ සහ ලජ්ජිතිස්ස රජුගේද නම් සඳහන් වේ. එයින් පැහැදිලිවන්නේ එම රජවරුන්ගේ කාලයන්ට අයිති විහාරස්ථානයක්වන බවයි. මහවැලි ගඟත් මාදුරු ඔයත් අතර කොටසකට මෙම විහාරය අයත්වේ. මහසෙන් රජතුමා මෙම විහාරය ආසන්නයේ ''දූරකගල්ල'' නමින් වැවක් කරවූ බව මහා වංශයෙහි සඳහන්වේ.මෙම ස්ථානයෙන් දැනට සොයාගෙන ඇති නටඹුන් වන්නේ ගරාවැටුණු දුගැබක්ද ලෙන් කිහිපයක් ද ප්‍රතිමාවක්ද වේ. අඩි80ක් පමණ දිග අඩි 25ක් පමණ පළල් ගල් ලෙනක් නිර්මාණය කර තිබේ. එහි ප්‍රතිමාවක් දක්නට ලැබේ. මෙම ප්‍රතිමාව නෙළීම සඳහා මැටි ගඩොල් භාවිතා කර ඇති අතර වර්ණයන්ද යොදාගත් බවට මූලික සාධක තිබේ.



ප්‍රතිමාවේ දිග අඩි 38ක් පමණ වේ. ඒ අසල කුඩා හිඳි පිළිමයක්ද දක්නට ලැබේ. අවට ප්‍රදේශය පුරා පැරණි ගඩොල් විසිරී පවතී. එහි නිර්මාණය වී තිබූ ගොඩනැගිලි කුමන ඒවාද? යන්න තීරණය කිරීම අපහසුවී ඇත. මෙහි ඇති ලෙන් ආශ්‍රිතව ශිලා ලිපි රාශියක් සොයාගෙන තිබේ. එම ලිපිවලින් හෙළිවන්නේ මෙම ලෙන් භික්ෂූන් වහන්සේලා උදෙසා පූජාකරන ලද බවයි. මෙම ලෙන්වල වනවාසී, භාවනානුයෝගී භික්ෂූන් වහන්සේලා වැඩ සිටින්නට ඇතැයි පුරාවිද්‍යාඥයින් අදහස් කරති. මෙහි වැඩ සිටි භික්ෂූන් වහන්සේලාට ප්‍රත්‍ය පහසුකම් අවට ජනතාවගෙන් ලැබුණු බව ලෙන්වල ඇති ලිපිවලින් පෙනීයයි.

පොළොන්නරු යුගයේද වනවාසී භික්ෂූන් වහන්සේලා මෙවැනි ලෙන් ආශ්‍රිතව වැඩ සිටින්නට ඇතැයි ඉතිහාසඥයින් අදහස් කරති. බාහිර වශයෙන් ඇතිවූ බලපෑම් හේතුකොට ගෙන මෙම ඓතිහාසික ස්ථානය විනාශ මුඛයට පත්වී ඇති බව ඉතිහාසගත තොරතුරු වලින් හෙළිවේ. ලාංකික ජනතාව සතු මෙවැනි පෞරාණික පූජනීය ස්ථාන ආරක්ෂා කිරීම අප සැමගේ පරම යුතුකම වන්නේය.



ඇම්.ඞී.විජයවර්ධන


ආචාර කරන්නහුට ආචාර කරන්න පුරුදුවන්න.



# මැදින් පොහෝදා සිදුවූ අසිරිමත් චාරිකාව

**සම්බුදු සිරිතේ දක්නට ලැබෙන උත්තරීතර මානව ධර්ම හා උන්වහන්සේ විසින් පරමාදර්ශයෙන් පෙන්වා වදාළ මානව ශිෂ්ඨාචාරයේ යහපැවැත්මට තුඩුදෙන යුතුකම් පද්ධතිය කවර සමාජයකට වුවද ඉතා වැදගත් මගපෙන්වීමක් ලබාදේ. සිඟාලෝවාද, මංගල, පරාභව වැනි සූත්‍ර ධර්ම මඟින් මේ බව තහවුරු වේ. ඥාතකානංච සංගහෝ" යනුවෙන් ඥාතීන්ට සංග්‍රහ කිරීම මංගල සම්මත කරුණක් ලෙස සම්මානිත නිගමනයකට පැමිණ ඇත්තේ ඥිතිත්වය යනු සදාතනික මානව ධර්මයක් ලෙස පිළිගැනීමෙනි. මැදින් පුර පසළොස්වක පොහෝ දිනය අපට සිහිපත් කරන්නේ ඥාති සංග්‍රහය පිළිබඳ බුදුන් වහන්සේගේ පරමාදර්ශයයි.**

තම පුතු අභිනිෂ්ක්‍රමණය කොට සත් වසරක් ගතවී මැදින් මස උදා වූ කල සුද්ධෝදන නිරිඳුන්ට බුදුන් දැකීමේ ආශාවක් උපන්නා. බුද්ධත්වයෙන් පසු ප්‍රථම ආරාම පූජාව ලෙස පිළිගත් මගධ රට වේළුවනාරාමයේ බුදුන් වහන්සේ වැඩ සිටින බව අසන්නට ලැබීමෙන් මහත් ප්‍රීතියට පත් සුදෝවුන් රජ බුදුන් වහන්සේ වැඩම කරවා ගැනීමට ඇමතිවරයෙකු සමඟ දහසක් පිරිස රජගහ නුවරට පිටත් කළේය. ඔවුහු බුදුන් වහන්සේගෙන් දහම් අසා රහත් බවට පත්ව පැවදි වූහ. මේ අයුරින් අමාත්‍යවරයෙකු ප්‍රධාන කොට දහස බැගින් කණ්ඩායම් නවයක්ම පිටත්කොට හැරියද ඔවුහු සියල්ලෝම බණ අසා රහත්ව පැවදි බවට පත්වූහ. අවසානයෙහි කාළුදායී ඇමති ප්‍රධාන දහසක් පිරිස දහවන පිරිස ලෙස පිටත් කළහ. එම ගමනේදී කළුදායී අමාත්‍යවරයා පැවදිවීමට අවසරයද රජගහනුවර වේළුවනාරාමයට ගොස් පෙර පිරිස සේම පැවදිබව ලබා පැවිදිබව ලබා සුදුසු දින එළඹී කල්හි පිය රජතුමාගේ ඇරයුම බුදුන් වහන්සේ වෙත දැනුවත් කළහ. එය සිදුකළේ



බුදුරදුන් සමීපයට ගොස් රජගහනුවර සිට කපිලවස්තු නගරය දක්වා ගමන් මග සොබා අසිරිය ගාථා කීපයකින් වර්ණනා කිරීමෙනි. කාළුදායී තෙරුන් වහන්සේ පින්බර සංවිධායකත්වයෙන් සිය ඥාතීන් දැක බලා ඔවුන් දහම් ඔසුවෙන් නිවා සනහන්නට කිඹුල්වත් නුවරට වැඩමකරන මහා අසිරිමත් චාරිකාව ඇරඹුණි. නවම්පුර පසළොස්වක පොහෝදිනය උදාවිය. පස්වග තවුසන් පැවිදි උපසම්පදාව ලැබීමත් සමඟ ආරම්භ වූ බුද්ධ ශ්‍රාවක පිරිස මේ වන විට විසිදහසක පමණ රහතන් වහන්සේලා පිරිසකි. මේ මහා සංඝ සනනිපාතය එදා නවම් පුන් පොහෝදා කපිල වස්තු පුරයට වැඩම කිරීම ඇරඹිණි.

බුදුන් වහන්සේගේ ඥාතීන් වන ශාක්‍ය වංශික කුලවතුන් තම ඥාතීත්වය අනුව සලකා මානයෙන් යුතුව බුදු සිරිපා නොවැඳ සිටි බැවින් යමාමහා පෙළ හරකින් තත් මානය බිඳ දැමීමට උන්වහන්සේට සිදුවිය. වෙස්සන්තර ජාතකයෙන් දහම් දෙසා සුද්ධෝදන මහ නිරිඳුන් සෝවාන් පලයට පත්කළ අප තිලෝගුරු බුදු පියාණන් වහන්සේ ඥාති සංග්‍රහයේ උත්තරීතර බල මහිමය තිලොවටම දැනෙන සේ දේශනා කළහ.

පසුදින මෙම රාජකීය දූතයාණන් වහන්සේ ගෙපිළිවෙලින් පිඩුසිඟා වඩිමින් අසිරිමත් බුදු සිරිතේ සම්භාවනීය පිළිවෙත ආදර්ශයෙන් පෙන්වා දුන්හ. පුතනුවනි අපගේ වංශයට නිගා නොකළ මැනවි. සිඟා කෑම ශාක්‍ය වංශිකයින්ට සුදුසු නොවේ යනුවෙන් ආයාචනා කරමින් සුද්ධෝදන නිරිඳුන් බුදුහිමියන් සමීපයෙහි වැඳ වැටුණි. එවිට බුදුන් වහන්සේ, පියාණෙනි, ශාක්‍ය වංශය ඔබේ වංශයයි. මගේ වංශය බුද්ධ වංශයයි. පිණ්ඩපාතය බුද්ධ වංශයේ සිරිතකි." යනුවෙන් පිළිතුරු දුන් සේක. එහිදී ශාක්‍ය වංශිකයින් බුදුන් ප්‍රමුඛ මහ සඟරුවනට දන් පිළිගැන්වූහ. එතැනදී දෙසූ දහම් පද අසා පියරජතුමා සකෘදාගාමී ඵලයටද පත් වූහ.

සසර පුරා බැඳි අපමණ සෙනෙහසින් පාරමිතා පූරණයට අතදුන් සොඳුරු බැඳිම යසෝදරාවන් බව සනාථ කරමින් ලොව ප්‍රථම ආදර කථාව ලෙසින් සම්මතව ඇති සඳකිඳුරු ජාතකය දේශනා කළ බුදුරජාණන් වහන්සේ යසෝදරාවන්ගේ ගුණකඳ බණ පදයක් බවට පත් කළ සේක.

කිඹුල්වතට වැඩි තුන්වනදා නන්ද කුමරුගේ පැවිදි වීමද සිදුවිය. ශාක්‍ය සිංහයානන්ගේ දේහ ලක්ෂණ හා ගමන් විලාසය පිළිබඳ නරසීහ ගාථා මඟින් ගුණ ගයා තම පුතුට පියාණන් හඳුන්වාදුන් යශෝදරාවෝ ඒ නරසිංහයාණෝ ඔබේ පියාණෝ" යැයි හඳුන්වාදුන්හ. පියාගෙන් පුතාට හිමිවිය යුතු දායාදය ඉල්ලා සිටි රාහුල කුමරු ශාසනික දායාදය හිමිකර ගත්තේ පැවිදි බව ලැබීමෙණි. මුගලන් මහා තෙරුන් වහන්සේ විසින් රාහුල කුමරුගේ කෙස් බා සිවුරු පොරවන ලදි. සැරියුත් මහ රහතන් වහන්සේ රාහුල කුමරු පැවිදි කළ අතර මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ උපාද්‍යායන් වහන්සේ වූහ.

රහල් කුමරුගේ පැවිද්දෙන් මහත් කම්පනයට පත් සුද්ධෝදන නිරිඳුන් බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ මව්පියන්ගෙන් අනුදැනුමක් නොවිමසා දරුවන් පැවදි නොකළ යුතු යැයි ඉල්ලා සිටි අතර උන්වහන්සේ එය තුෂ්ණීම්භූතව පිළිගත් සේක.

සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේ ඉපිද සත්දිනකින් මහාමායා දේවිය කළුරිය කොට තුසිත දෙව්ලොව උපත ලදහ. එදා සිටම උන්වහන්සේට සුළුමව වූයේ ඥාතිත්වයට වුවද සිදුහත් චරිතයට බුද්ධ මාතා වූයේ ප්‍රජාපතී දේවියයි. ඇයට දහම් දේශනා කොට සෝවාන් ඵලයට පත් කරමින් කෘතවේදිත්වය අර්ථවත් කළහ.

මැදින් පුන් පොහෝදා සිදුවූ මෙම අසිරිමත් ප්‍රාතිහාර්යාත්මක සිහිවටනයක් මගින් අපට විද්‍යාමාන වන්නේ අසිරිමත් පෙළහර නොව මානව ශිෂ්ඨාචාරයේ උත්තරීතර වූ හෘදයාංගම ලේ සුවඳක අරුමයයි.

කුරුණෑගල විසුද්ධායන විද්‍යායතන පිරිවෙනේ ආචාර්ය ශාස්ත්‍රපති වික්‍රමසිංහ අතපත්තු



## මැදින් පොහොය දින වැදගත්කම

1. බුදු වී කිඹුල්වත් නුවරට වැඩම කිරීම.
2. මහා ප්‍රජාපතී ගෝතමියට ධර්ම දේශනා කිරීම.
3. රාහුල කුමරුන් පැවදි වීම.
4. නන්ද කුමරු පැවදිවීම.
5. ශ්‍රී පාද වන්දනාව සඳහා ජනප්‍රිය දිනය වීම.



# නිවන් මගට පාර කියන නිදහස් ජීවිතය

**මිනිසුන් ජීවත් වී සොයන්නේ සැපයයි. ඔවුන් දුකෙන් තොරව ජීවත් වීමට සෑම උත්සාහයක්ම දරති. හොඳින් අධ්‍යාපනයක් ලැබ, ධනය උපයාගෙන, දේපල අත්පත් කරගෙන, හොඳ පවුල් ජීවිතයක් ඇතිකරගෙන, කාටවත් අත නොපා, නිදහස්, නිවහල් ජීවිතයක් ගතකිරීම සෑම දෙනාගේ අභිප්‍රාය වේ.**

සම්මුති ලෝකය තුළ කිසිවෙකුට මෙහි වරදක් නොපෙනෙයි. සාමාන්‍ය ජීවිතයක ජයග්‍රහණය වන්නේ ද මෙයයි. මෙම අභිමථාර්ථ ඉටුකරගැනීමට ද මහත් වෙහෙසක්, උත්සාහයක්, වීර්යයක් තිබිය යුතුය. උදේ පටන් රෑ වෙනකම්, රැය පහන්වන කම් පාඩම් කරමින් රැකියා කරමින්, ගේ දොර වතුපිටිවල වැඩ කරමින්, දඟලන්නේ මෙම සම්මුති ලෝකය ජයගැනීමටය.

සාමාන්‍ය ලෝකයේ ජීවත්වන අයෙකුට මෙයින් මිදිය නොහැක. එම නිසා කෙසේ හෝ සමාජයේ පිළිගත් අරමුණු කරා ගමන් කිරීමට කටයුතු කරයි. එනම් මිනිසුන් වර්තමාන කාලයේ දුක් විඳිමින් අනාගතයේ ඉහළ පිළිගැනීමක් හොඳ සමාජ තත්වයක් සහිතව භෞතිකව පෙනෙන ලෝකය තුළ සැපක් ඇතිකර ගැනීමට උත්සහවන්ත වේ.

ජීවිතයේ සැප ලෙස වගේම තමන් අත්පත් කරගෙන ඇති සම්පත් වලට වහල්කම් කළ යුතුය. තමන් අත්පත් කරගෙන ඇත්තේ රෙදි කෑලි, ලී කෑලි, ප්ලාස්ටික් කෑලි, ලෝහ කෑලි යනාදී දේවල්ය. කිලිටි වූ රෙදි ටික, අපට සෝදන්න කියයි.

එවිට තමුන් වහලෙක් මෙන් ඒවා සෝදයි. දූවිලි සහිත මේසය, ''මාව පිහින්න'' කියයි. එවිට වහලෙක් මෙන් මේසය පිහදමයි. දැන් කෙනෙකුට ප්‍රශ්නයක් එන්න පුළුවන් පිරිසිදුව ජීවත්වීම වැරදිද? කියලා. එය වැරදි නැත. නමුත් පිරිසිදු කර ඉවරකළ නොහැකි බව අවබෝධ කළ යුතුය. එමෙන්ම සිහින ලෝකයේ ඇති මෝටර් රථය ''මාව ගන්න ඕනෙ නම් අතිකාල වැඩකරපන්'' කියයි. තමුන් අතිකාල වැඩ කරයි. සාදන අලුත් ගෙදර ''ඔහොම හම්බකරලා බෑ, කොමිස් ගහල හරි, අල්ලස් අරන් හරි, හොරකම් කරල හරි මාව හොඳට හදපන් '' කියයි. එවිට එයද කරයි. මේ ලෙසට වහල්කම් වලට පාපකම් ද එකතු වේ.

එමෙන්ම සමාජය විසින් තමුන් වහලෙකු බවට පත්කර ඇත. අනිත් අය විසින් නියම කරන ලද සමාජ තත්වය ඇතිකර ගැනිමට, සමාජය කියන කියන දේ කරයි. රූපවාහිනියක හෝ වෙනත් මාධ්‍ය වල වෙළඳ දැන්වීම්, වැඩසටහන් වලින් මේ මේ දේවල් මේ ලෙසට කන්න, මේ මේ දේවල් මේ ලෙසට බොන්න, මේ ආකාරයට නාන්න, මේ විදියෙ වාහනයකින් යන්න, මේ විදියේ අධ්‍යාපනයක් ලබන්න, මේ විදියට මුදල් උපයන්න, මේ විදියේ රැකියාවක් කරන්න යනාදී ලෙස කියයි. මෙසේ තමන්ට අවශ්‍ය නැති දේවල්, එහෙත් අත්‍යාවශ්‍ය දෙයක් ලෙස ඉස්මතු කරමින් පෙන්වන නිසා, ඊට මුලා වී කරන වහල්භාවය තමුන්ටම නොපෙනේ. මෙහිදී තමන්ගේ අවශ්‍යතාවය මත නැවතී සිට කටයුතු කිරීම මදි පුංචිකමක් ලෙස සිතා, අනිත් අයට වුවමනා විදියට කටයුතු කිරීමේ වහල් ක්‍රියාව මහත් අභිමානයක් ලෙස දකියි.

බුදුපියාණන් වහන්සේ ලෝකයේ මනාප අරමුණකින් සුබ වේදනාවක් ඇතිවන බවත්, එය හටගත් මොහොතේම දියබුබුලක් මෙන් බිඳී විනාශ වී ඒ තුළින් විපරිනාම දුක්ඛතාව ඇතිවන බවත්, යම් අමනාපික අරමුණකින් දුක්ඛ වේදනාවක් ඇතිවන බවත්, ඒ තුළින් දුක්ඛ දුක්ඛතාවය ඇතිවන බවත් යම් උපේක්ෂා සහගත අරමුණකින් අදුක්ඛම සුඛ වේදනාව ඇතිවන බවත්, ඒ තුළින් සංඛාර දුක්ඛතාවය ඇතිවන බවත්, දේශනා කර ඇත. මෙම බුදුවදන තුන් ලෝකයේ කිසිවෙකුට වෙනස් කළ නොහැක. කළහැකි වන්නේ බුදු වදන පිළිගෙන සත්‍ය අවබෝධ කරගෙන දුකින් අතමිදීම හෝ බුදුවදන නොපිළිගෙන දුක්විඳීමයි.

බෝසතාණන් වහන්සේ රම්‍ය, සුරම්‍ය, සුභ යන මාලිගා පරිහරණයෙන් සහ රජකුමරකු වශයෙන් මහත් සැපයක් විඳින ලදී. සර්වඥයන් වහන්සේ එම සැපය උපමාකර ඇත්තේ තුවාලයක් කසන විට ඇතිවන ඉතා කුඩා වූ සැපයකටය. එමෙන්ම ගිහිකල රජ කුමාරයෙකු වශයෙන් විඳි සැපයට වඩා පළමු ධ්‍යාන සැපය උසස් බව වැඩිදුරටත් දේශනා කර ඇත.

තමුන් මෙලෙස වහල්කම් කරමින් අත්පත් කරගන්නා දේවල් තමන්ට අවශ්‍ය ලෙස පැවැත්විය නොහැක. ඒවා වෙනස් වේ. තමන්ගේ ශරීරයවත් තමන්ට අවශ්‍ය විදිහට පැවැත්විය නොහැක. ඇස දිරයි, කණ දිරයි, හම රැලි වැටෙයි. නොයෙක් ලෙඩ රෝග වැළඳෙයි. අනිකුත් දේවල් ද එලෙසම දිරයි. විනාශ වේ.

මෙලෙස වෙනස්වන, විනාශවන දේවල් රැස් කිරීමටත් ඒවා පවත්වාගෙන යාමටත්, පරපණ නැසීම, සොරකම් කිරීම, කාමය වරදවා හැසිරීම, බොරු කීම, පරුෂ වචන කීම, කේලාම් කීම, හිස් වචන කීම, මත්ද්‍රව්‍ය භාවිතා කිරීම, ඊර්ෂ්‍යා කිරීම, වෛර කිරීම, ක්‍රෝධ කිරීම, අනුන්ගේ ගුණ මැකීම යනාදී මහා අකුසලයන් සිදුකරයි.

15 පිටුවට...

පූජ්‍ය
මැල්සිරිපුර ධම්මකුසල හිමි



# විස්මිත ගුණ ඇති රංදෙණේ ගාථා

**අවිහිංසාව, අවංකබව, පිරිසිදු චරිතය, සත්‍යවාදිබව යහපත් සංකල්පනා යන පංචවිධ ප්‍රතිපත්තීන් බෞද්ධ දර්ශනයේ සඳහන් මංගල සම්මත විනය ශික්ෂාවන් වේ.**

සතරමඟ සතර ඵල කෙළවර නිර්වාණාවබෝධය ලැබීමේ ඒකායන ගමන් මඟ උත්තරීතර මනුෂ්‍යත්වය වටා විහිද පවතී.

මනුෂ්‍ය දේවතාවා මනුෂ්‍ය මනුෂ්‍යා, මනුෂ්‍ය යක්ෂයා, මනුෂ්‍ය ප්‍රේතයා ලෙස මිනිසා සතර ආකාර වන්නේය. මෙයින් මනුෂ්‍ය මනුෂ්‍යා සහ මනුෂ්‍ය දේවතා යන කොටස් දෙකට පමණක් නව අරහාදී  සම්බුද්ධ දේශනා ගෝචර වන්නේය.

බුදුරජාණන් වහන්සේ නිර්වාණ මාර්ගයේ දී පෙන්වා දුන්නාක් මෙන්ම නිවන් දක්නා තෙක් භාග්‍යමත් ජීවිතයක් ගතකිරීමේ උසස් ජීවන මාර්ගයක්ද පෙන්වා දුන් සේක.

මානව සංවර්ධනය තුළින් මුළු මහත් ලෝකයම දියුණු කළ හැකිය. ඒ සඳහා පළමුව මිනිසා ගුණ නුවණින් පරිපූර්ණ කළ යුතුය.

මිනිසා සෑදීමේ පළමු පියවර මිනිස් සිත සෑදීමය. සාමකාමී, සදාචාර සම්පන්න හා පවුලට හිතැති මිනිසෙකු බිහිකිරීම අද අප රටේද කාලීන අවශ්‍යතාවයක්ව පවතී.

සම්බුද්ධ චරිතය හා සම්බන්ධ සූත්‍ර දේශනා රැසක් මගින් මිනිසාගේ යහපත සහ සර්ව සුභ සිද්ධිය ලඟා කරගත හැකිබව බෞද්ධයෝ ඉඳුරාම දන සිටිති.

මෙම ලිපියෙන් අදහස් කරන්නේ එවන් ස්වර්ණමය සූත්‍ර ධර්ම කරුණු පිළිබඳව ඔබ දැනුවත් කිරීමටය.

රන්කඳ (ස්වර්ණමය රූපස්කන්ධය (රූපය) ගෞරවාර්ථියෙන් රංදෙණ නම්විය.

## රංදෙණේ ගාථා පළමුවැන්න.

***නමෝ තේ කරුණාසාර***
***නමෝ තේ මතිසාගර***
***නමෝ තේ අමතාකාර***
***නමෝ තේ අමනතඥ්ඤාව***
***රංසිමාල නමෝ මය්හං***
***(තුය්හං)***
***නරම්බු රූහ මණ්ඩලං***
***ජාලමාල නමෝ මය්හං***
***(තුය්හං)***
***නාව භාවා රංසැදැසැදවානල***
***ඉධානත්ති ගුණාධාර***
***සද්ධම්ම රත්නාකර***
***පාරිද්වන්දාමිතේනාථ***
***සද්ධායතන මුද්ධනා***

භාතිය නම් වූ රජතුමාට රත්නමාලී නම් වූ මහා චෛත්‍යයෙහි මාතු ගර්භය පවා මෙකී සර්වඥ නමස්කාරයෙන් විවෘත වූ බවක් ජනවහරෙහි පවති. පුද පූජා නොලබන සර්වඥ ධාතු පෙති පිළිම ගෙන්වා ගැනීමේදී භාවිතයෙහි පවතින නමස්කාරය සමඟ මෙහි සඳහන් නමස්කාරය දෛනිකව භාවිතා කරළීම තුළින් අභිමතාර්ථ සාධනයට මෙකී දැහැනෙන් විස්මිත ඵලදායි ප්‍රතිඵල ලබාගත හැකිය.

ශාන්තිනායක අමාමෑණියන් කුසිනාරානුවර මල්ල නම්වූ රාජ්‍යය තාන්ත්‍රිකයන්ගේ ශාල වනෝද්‍යානයේදි අනුපාධිශේෂ මහා පරි නිර්වාණයෙන් පිරිනිවන් පා වදාළ සේක. සම්බුද්ධ ශාසනයෙහි අග්‍රශ්‍රාවක ධුරන්දරවූ මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ මෙකී අතිශෝචනීය අවස්ථාවෙහි වැඩ නොසිටිය සේක.

කුසිනාරා නුවර බලා පාවා නම් නුවර සිට පන්සියයකට අධික භික්ෂු මහා සංඝයා සමඟ තමන් වහන්සේ පැමිණ රංදෙණ පැදකුණු කොට භාග්‍යවතුන් වහන්සේ සිරිපා නමදින තුරු චිතකය නොදල්වෙන ලෙස අධිෂ්ඨාන කළ සේක. ප්‍රබල දෙවි දේවතා ආශිර්වාද ලැබි අධිෂ්ඨාන බලයකින් එසේ වුවායයි ඉපැරණි පොතපතෙහි සටහන් කර ඇත.

*''අථබෝ ආයස්මා*
***මහා කස්සපෝ යේන***
***කුසිනාරා මකුට බන්ධනං***
***නාම මල්ලානං චේතියං යේන***
***භගවතෝ චිතකෝ තේනු***
***පසංකමි උපසංක මිත්වා***
***ඒකංසං චීවරං කත්වා***
***අඤ්ජලිං පණාවෙත්වා***
***තික්තවත්ථුං චිතකං***
***පදක්ඛිණං කත්වා***
***පාදතෝ විවරිත්වා***
***භගවතෝ පාදේ***
***සිරසා වන්දි තානිපි බෝ***
***පඤ්චව භික්ඛු සතානි***
***ඒකංසං චීවරං කතවා***
***අඤ්ජලිං පණාවෙත්වා***
***සික්ඛෙත්තුං චිතකං***
***පදක්ඛිණා කත්වා භගවතෝ***
***පාදේ සිරසා වන්දිංසු***
***වන්දිතෝච පනායස්මතෝ***
***මහා කස්සපේන***
***සෝභගවතෝ පංචනි භික්ඛු***
***සතේහි***
***සයමේව භගවතෝ***
***චිතකෝ පජ්ජලි***

(මහා පරිනිබ්බාණංසුත්ත - දීඝනිකාය)

ආයුෂ්මත් මහා කාශ්‍යප මහා රහතන් වහන්සේ තෙවරක් රංදෙණවටා පැදකුණු කොට භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් සිරසින් වන්දනා කළ සේක. ඉක්බිතිව අවසේස පන්සියයක් භික්ෂු සංඝයාද වන්දනා කළ සේක. ඉන්පසු ගිනි දැල්වීම සඳහා මහා කාශ්‍යප මහරහතන් වහන්සේ දේශිත දේශිත නමස්කාරයන් විසින් ආකාර කීපයකින් ඉන්පසු සම්බුද්ධ ශාසනයට එක්විය.

## රංදෙණේ ගාථා දෙවැන්න

***සබ්බේ සංඛත ධම්මේසු***
***ඔත්තප්පාකාර සණ්ඨිතා***
***ඤාණ මෝහිත භාරානං ධම්ම***
***සංවේග සඤ්ඤිතා***

***සස්සරී කතරෝ භාවෝ***
***පක්තුමාලාය ලංකතෝ***
***දක්ඛිණාවත්ත කේතෝසි***
***නිලාවිල සිරෝරුහෝ***

***උණ්හිස සීසෝ රවිරෝ***
***පරිපුණ්ණ වේරොචරා***
***අනෝලෝකය මුද්ධාසි***
***සුගන්තර මුද්ධනෝ***

අමාමෑණි සම්බුදුරජාණන් වහන්සේගේ අසීමිත ගුණ සමුදාය මෙහි සදහන් පළමු ගාථාවෙන් විවරණය වෙයි. දෙවන ගාථාවෙන් ශාරීරික ලක්ෂණයන් ප්‍රකාශ වෙන අතර අක්ෂර 108කින් අනූන පළමු රං දෙරණේ ගාථා කොටස් අතිශය වැදගත් වෙයි.  එක් පේලියකට මාත්‍රා 18 බැගින් පේළි සයකින් 108 වෙයි. මුල සංඛ්‍යාව 9කි. ඒවං තං බුද්ධ ජනාථ බුද්ධං තං විලෝචනං යන්න මහා කාශ්‍යප හිමිගෙන් ප්‍රකාශ නොවුනක් බවද පෙනී යයි.

කොත්මලේ විජිත ඞී.
ලියන ආරච්චි



# මෙලොව පරලොව සතුටුවිය හැකි පිංකම් මොනවාද?

දේශකයාණෝ
ගොකරැල්ල ශ්‍රී ධර්මප්‍රදීපාරාමාධිපතිනී
ශාස්ත්‍රවේදී වත්තේගම
කුසලධම්මා මෙහෙණින් වහන්සේ විසිනි.

*ඉධ නන්දතී පෙච්ච නන්දති - කථ පුඤ්ඤො උභයත්ථ නන්දති*
*පුඤ්ඤං මෙ කථන්ති නන්දති - භීයො නන්දති සුග්ගතිං ගතො*

**ශ්‍රද්ධා බුද්ධි සම්පන්න පිංවත,**

මාගේ තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාරණවා යම්කිසි පුද්ගලයෙක් පිංකම් කරන්නේ නම් ඒ පුද්ගලයාට මා විසින් පිංකම් කළා කියල මෙලොවත්, පරලොවත් සතුටු වියහැකි බව. මෙලොව පරලොව දෙලොවම සතුටුවන පිංවතා සුගතියට පත්වන්නේ බෙහෙවින්ම සතුටුවයි. ඉහත සඳහන් ධම්ම පද ගාථාවේ සඳහන් වෙන්නේ.

පිංවත, මෙලොව පරලොව සැප විපාක දෙන, මෙලොව පරලොව සතුටුවිය හැකි මේ පින්කම් මොනවාද? දස පුණ්‍ය ක්‍රියා හැටියට පිංකම් දහයක් තියෙනවා. ආරාම රොපා වණරොපා............" ආදී වශයෙන් හැමදා පිං වැඩෙන පිංකම් කීපයකුත් වණරෝප සූත්‍රයේ සඳහන් වෙනවා.

කඨිනටඨ පරික්ඛාරං වාසදානංච උතතමං......" ආදී වශයෙන් අටමහා කුසල් නමින් මහා පිංකම් අටක් පිළිබඳවත් දේශනා වෙනවා.

වණරෝප සූත්‍රයේ සඳහන් වෙන විධියට පල වැල සහිත ගස් කොළන් සිටු වීම, උද්‍යාන සකස් කිරීම, ගස් වැල් සහිත කැළෑ සකස් කිරීම, ඒදඩු පාලම් සකස් කිරීම, මං මාවත් ඉදිකිරීම, ලිං පොකුණු සෑදීම, කියන කාර්යයන් තුළින් මිනිසුන්, සිව්පාවුන්, පක්ෂීන්, උරඟයින් කුරා කුහුඹුවන්ගේ පටන් සියළු සතුන්ට නිරන්තරයෙන් පහසුව සැලසෙන නිසා දිවා රාත්‍රිය පිං වැඩෙන පිංකම් බවට පත්වෙනවා. මේවා තුළින් මෙලොවත් පරලොවත් සතුට සැපත ලබාගන්න හැකියාව තියෙනවා. මහා පිංකම් අට හැටියට සඳහන් වෙන්නේ,

**කඨින චීවර පූජාව**
**අටපිරිකර පූජාව**
**ආවාස (සංඝාවාස) පූජාව**
**බුද්ධ ප්‍රමුඛ සංඝයාට දෙන දානය**
**ශ්‍රී සද්ධර්මය ලිවීම හා ලියවීම**
**සංඝයාට කෙත්වතු පූජා කිරීම**
**බුද්ධ ප්‍රතිමා නිර්මාණය කිරීම**
**සංඝරත්නය උදෙසා වැසිකිලි තනවා පිදීම**

ඉහත පිංකම් හේතුවෙන් ලෞකික වශයෙන් ලැබිය හැකි ශ්‍රේෂ්ඨම තත්වය වන චක්‍රවර්තී රාජ්‍යයේ පටන් සියළුම දිව්‍ය මානුෂීය සම්පත් ලබා ගැනීමටත් සසර සිදුව ඇති සුළු අකුසල් සියල්ල නැතිකර ගැනීමටත් හැකියාව ලැබෙනවා. ඒ කියන්නේ මෙලොව, පරලොව සැප ලැබීමට අටමහා පිංකම් ඒකාන්තයෙන් හේතු වාසනාව ලැබෙනවා.

අපගේ මෙලොව පරලොව සැප විපාක ලැබෙන තවත් පිංකම් දහයක් තියෙනවා. ඒ තමයි දස පුණ්‍ය ක්‍රියා.

**දානං සීලං ච භාවනා**
**පත්ති පත්තානු මෝදනා**
**වෙයයා වච්චා චායංච**
**දෙසනා සුතී දිටඨිජු**

මෙහි පළමු පිංකම දානය. දානය විවිධාකාරයෙන් සිදුකළ හැකියි.

ආමිස දාන, අභය දාන, ධර්ම දාන, වශයෙන් දානය ත්‍රිවිධාකාර වෙනවා. මේ ත්‍රිවිධාකාර දාන අතුරෙන් ශ්‍රේෂ්ඨතම දානය ධර්ම දානය බව සබබ දානං ධම්ම දානං ජිනාති" යන බුදු වදනින් දැක ගත හැකියි. ධර්ම දානය කියල කියන්නේ ධර්ම දේශනා කිරීම, ධර්ම සාකච්ඡා කිරීම, දහම්පොත් ලිවීම, ලියවීම, ධර්ම දේශනා කරවීම ආදියයි.

දෙවැන්න උභය දානයයි. උබය දානය කියල කියන්නේ ජීවිතය ලබාදිම කියන එක. ඒ කියන්නේ මරණයට නියමවුන මිනිසුන්, සතුන් මරණයෙන් මිදීම සහ මුදවා ගැනීම.

තුන්වැන්න තමයි ආමිස දානය, ආමිස දානය කියල කියන්නේ ඇසින් දැකිය හැකි, අතින් පිදිය හැකි සියලුම භෞතික වස්තූන් පූජා කිරීම හා පරිත්‍යාග කිරීම මෙහිදී පූජාවන් වශයෙන් මහා පින්කම් අටට අයිති දේවල් ඇතුළුව චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස, කියන සිව්පස පූජාවන් මහසංඝරත්නය උදෙසා පූජා කිරීමත් නිතර පිංවැඩෙන පිංකම් ඇතුළුව ආහාරපාන, ඇදුම් පැළඳුම්, අධ්‍යාපනික උපකරණ, බෙහෙත් ද්‍රව්‍ය, නිවාස ආදිය අනුකම්පාවෙන් රෝගීන්ට, අසරණයන්ට, යාචකයන්ට, දිළින්දන්ට, තිරිසන් සතුන්ට ලබාදිමත් ආමිස දානයට අයිති වෙනවා.

මේ ආමිස දානයේදී පිංවත, ඒ ඒ උත්තමයාගේ ශීලයේ ජ්‍යෙෂ්ඨ භාවයට ගුණයේ ජ්‍යෙෂ්ඨ භාවයට අනුවයි ආනිසංස ලැබෙන්නේ.

පූජාවක් ලෙසින් ලොව්තුරා බුදු, පසේ බුදු, මහරහත් වහන්සේලා උදෙසාත්, මාර්ග ඵලාදී උතුමන් වහන්සේලා උදෙසාද, පෘතගජන භික්ෂු භික්ෂුණී, උපාසක,උපාසිකා යන සිව්වනක් පිරිස උදෙසාද යමක් පූජා කිරීමෙන් මහත්ඵල මහානිසංස ලබා ගත හැකියි. එහිදීත් උපාසක, උපාසිකා වන්ට පූජා කරන දානයට වඩා භික්ෂු, භික්ෂුණීන්ට පූජා කරන දානයේ ආනිසංස ප්‍රබල වන අතර පෘතග්ජන භික්ෂු භික්ෂුණීන් වහන්සේලාට පුදන දානයේ ආනිසංස ප්‍රබල වන අතර එම දානයට වඩා පසේ බුදු, ලොව්තුරා බුදුරජාණන් වහන්සේට වශයෙන් ආනිසංස ප්‍රබල වෙනවා.

අනුකම්පාවෙන් දෙන දානයත් ඒ ආකාරයෙන්ම දැනගත යුතු වෙනවා.

සඳහන් කරන්නට යෙදුන සියළු දානයන්ගේ ආනිසංස වශයෙන් මෙලොව පරලොව, ආහාර පාන, ඇඳුම් පැළඳුම්, යානවාහන, නිවාස ලබාගැනීමේ භාග්‍ය ලැබෙනවා.

දස පුණ්‍ය ක්‍රියාවේ දෙවන පිංකම ශීලය. පිංවත ශීලය ලෞකික, ලෝකෝත්තර වශයෙන් දෙවැදෑරුම් වෙනවා. පුණ්‍ය කර්ම ගණයට වැටෙන්නේ ලෞකික ශීලය පංච ශීලයේ පටන් උපසම්පදා ශිලය දක්වා සියළුම ශීලයෝ ලෞකික ශීලයන් වන අතර සෝවාන් ඵලයෙන් එහා මාර්ගඵල ලාභී උතුමන් වහන්සේලා ආරක්ෂා කරන ශීලයෝ ලෝකෝත්තර ශීලයන් වෙනවා.

"දස පුණ්‍ය ක්‍රියාවේ දෙවන පිංකම ශීලය. පිංවත ශීලය ලෞකික, ලෝකෝත්තර වශයෙන් දෙවැදෑරුම් වෙනවා. පුණ්‍ය කර්ම ගණයට වැටෙන්නේ ලෞකික ශීලයයි. පංච ශීලයේ පටන් උපසම්පදා ශිලය දක්වා සියළුම ශීලයෝ ලෞකික ශීලයන් වන අතර සෝවාන් ඵලයෙන් එහා මාර්ගඵල ලාභී උතුමන් වහන්සේලා ආරක්ෂා කරන ශීලයෝ ලෝකෝත්තර ශීලයන් වෙනවා"

බෝග සම්පත් ලැබීම, කීර්තිය ලැබීම, තේජය ලැබීම, නොමුලාව මරණට පත්වීම, දිව්‍යලෝක සම්පත් ලැබීම, නිරෝගී පැහැපත් සිරුරක් ලැබීම ආදී සම්පත් ලෞකික ශීලයේ බලයෙන් ලබාගත හැකි බව විසුද්ධි මාර්ගයේ සඳහන්ව තිබෙනවා.

දස පුණ්‍ය ක්‍රියාවේ තුන්වන අංගය පිංවත භාවනා" භාවනාවත් ලෞකික ලෝකෝත්තර වශයෙන් කොටස් දෙකකට බෙදනවා. කමටහන් 40 ක් වූ සමථ භාවනාව තමයි පිංවත ලෞකික භාවනා කොටසට අයිති වෙන්නේ. ත්‍රිලක්ෂණ භාවනාව නැත්නම් විදර්ශනා භාවනාව ලෝකෝත්තර භාවනාව හැටියට හඳුන්වනවා.

පිංවත අපට නිවන් මග විවර කරන්න නම් ලෝකෝත්තර ශීලයත්, ලෝකෝත්තර භාවනාවත් අනුගමනය කරන්න ඕන. මේ ලෝකෝත්තර ශීලයටත්, භාවනාවටත් කියනවා කුසලය" කියලා. එයින් පැහැදිලි කරගත යුතු විශේෂ දෙයක් තියෙනවා. ඒ තමයි නිවන් දකින්නට නම් කුසල් වැඩිය යුතු අතර අකුසල් දුරු කරන්න ඕන.

සසර සැප ලබන්න නම් පිංවත පිං කරන්න ඕන. පව්කම් කළොත් සසර අනන්ත දුක් ලබන්න වෙනවා. සසර සැප පිණිස සිදු කළ හැකි භාවනාවන් මොනවාද?

**1 දස කසින**
**2 දස අසුභ**
**3 දස අනුස්සති**
**4 සතර බ්‍රහ්ම විහරණ**
**5 සතර ආරුප්ප**
**6 ආහාරෙ පටික්කූල සංඥාව**
**7 චතු ධාතු වවත්ථන.**

පඨවි කසින, ආපො කසින, තෙජො කසින, වායො කසින, නීල කසින, පීත කසින, ලොහිත කසින, ඕතාද කසින, ආලෝක කසින, පරිච්ජින්තාකාස කසින, වශයෙන් කසින භාවනාව කර්මස්ථාන දහයකින් කළ හැකියි. අසුභ භාවනාව උද්ධුමානක, විනීලක, විප්‍රබ්බක, විච්ජිද්දක, වික්ඛායිතක, වික්ඛිත්තක, හත වික්ඛිත්තක, ලොහිතක, ප්‍රලවක, අට්ඨික වශයෙන් මළ කඳක් දිනෙන් දින විනාශවෙන, වෙනස් වෙන වගේම එහි යථා ස්භාවය මැනවින් දකිමින් දස ආකාරයකින් භාවනා කළ හැකියි.

බුද්ධානුස්සති, ධම්මානුස්සති, සංඝානුස්සති, ශීලානුස්සති, චාගානුස්සති, දෙවතානුස්සති, මරණානුස්සති, කායගතානුස්සති, ආනාපානා සති, උපසමානුස්සති වශයෙන් දස අනුස්සති වඩන්න පුළුවන්.

මේ අනුස්සති වැඩීම තුළින් තුනුරුවන් පිළිබඳව ශ්‍රද්ධාව, තුනුරුවන් පිළිබඳව දැන ගැනීම, සීලය නිවැරදිව ආරක්ෂා කිරීමට

15 පිටුවෙන්.....



# බුදු දහමේ ඉගැන්වෙන දානය ගැන දැනගනිමු

# සත්පුරුෂ දාන අට

මජ්ඣිම නිකායෙහි අට්ඨක නිපාතයෙහි **සත්පුරුෂ දාන සූත්‍රයෙහි සත්පුරුෂ දාන අටක් ගැනද සඳහන් වේ.**

1. පිරිසිදු දෙය දීම (සුචිං දෙති)
2. ප්‍රණීත දෙය දීම (පණීතං දෙති)
3. සුදුසු කල්හි දීම (කාලේන දෙති)
4. කැපවූවක් දීම (කප්පියං දෙති)
5. පරීක්‍ෂා කොට දීම (විචෙය්‍ය දෙති)
6. නිරතුරු දීම ( අභිණ්හං දෙති)
7. දෙමින් සතුටු වීම (දදං චිත්තං පසාදෙති)
8. දුන්පසු වඩාත් සතුටු වීම (දත්වා අත්තමනො හෝති)

මේ අයුරින් යමෙක් දානය දීම කරයි නම් ඔහු සත්පුරුෂයෙක් වශයෙන් සත්පුරුෂ දානයක් දෙන්නෙක් වෙයි. අප විසින් දිය යුත්තේද එසේමය.

අද බොහෝ දෙනා දන් දෙන්නේ නිසි අවබෝධයකින් තොරව බව ඔබටද වැටහී යනු ඇත. එවන් දාන අසත්පුරුෂ දාන පහට ගැනෙනු ඇත.

1. සකසා නොදීම
2. ගෞරවයෙන් නොදීම
3. සියතින් නොදීම
4. ඉවත දමන්නාක් මෙන් දිම
5. කර්මපල ඇදහීමෙන් තොරව දීම

## 1. සකසා නොදීම

සමහර අය කාර්යය බහුලත්වය නිසා හෝ අවිවේකී බව නිසා දීමට අවශ්‍ය නිසා කලබලයෙන් එහෙන් මෙහෙන් තම්බා ලුණු ඇඹුල් පවා පදමට නොදමා මනාව සකස් නොකොට කලබලයෙන් විහාරස්ථානයට හෝ නිවසකට ගොස් අමනාපයෙන් මෙන් දන් දීම මෙම සකසා නොදිමට ඇතුලත් වේ. එවන් දානයක් තුළින් මහත් වූ පිනක් ලැබිය නෙහෙකිය. එය අසත්පුරුෂ දාන ගණයට අයත් වේ.

ඔබ ඔබේ හදවතට කතාකර බලන්න. මේ අයුරින් නොදැන හෝ දානය දී ඇත්නම් මින් ඉදිරියට ගෞරවාන්විතව සැළකිල්ලෙන් යුතුව දානය පිරි නමන්න ඔබට මහත්පල මහානිසංස හිමි වීමට භාග්‍ය ඇත.

## 2. ගෞරවයෙන් නොදීම

ඔබ යමක් දෙනවානම් එය ලබන පුද්ගලයා මොන තත්වයක ජීවත් වන පුද්ගලයෙක් වුවත් එය ඔහුට දිය යුත්තේ ගෞරවයකිනි. යාචකයෙකුට විය හැක, අසල්වැසියෙකුට විය හැක, සිල්වතෙතකුට විය හැක. එසේත් නැතිනම් තිරිසන් සතෙකුට වියහැක. මේ කාට දුන්නත් ඔබේ හදවතේ අන්කම්පාව, කරුණාව,ගෞරවය ඇති විය යුතුය.එසේ නොමැතිව වෛරයෙන් කෝපයෙන් කරදරයෙන් බේරිමට පිළිකුල් සිතින් අහක බලාගෙන තිරිසන් සතෙකුටවත් යමක් නොදිය යුතුය.

යාචකයෙක් පැමිණි විට පොතු ගැලවුන බෙලෙක් පිඟානකට හෝ අඬුව කැඩුන කෝප්පයකට කහට ටිකක්, ආහාර ගේ ඉදිරිපිට මිදුලේ වාඩිකරවා දෙන නෝනාවරුන් මා දැක ඇත්තෙමි. ඒ අවස්ථාවන්හීදි ඔබ යමක් දුන්නායයි ඔබට හැඟෙන්නට ඇති. එහෙත් එය ඔබ සත්පුරුෂව දුන් දෙය නොව අසත්පුරුෂව දුන් දෙයක් බවට පත්වන අයුරු සිතට ගන්න. මා මෙයින් අදහස් කරන්නේ ඔබේ නිවස තුළටම කැඳවා කැම කාමරයේ කෑම මේසයට තබා දීමක් නොව එසේ කිරීමට ඔබට හැකියාවක් ඇත්නම් ඔබ නියම සත්පුරුෂයෙක්මය.

නිවසෙහි ඉදිරි පසට එන බල්ලෙකුට පූසෙකුට මොන කරදරයක්ද මන්ද? කියමින් ආහාර

> **" දානය නැමති උතුම් ක්‍රියාවෙහි නියැලෙන ඔබ ශ්‍රද්ධාවෙන් යුතුව මහා කරුණාවෙන් එය කළ යුතුය. එසේ නොමැතිව ඔබට පාවිච්චියට ගත නොහැකි දෙයක් ඉවත දමන්නාක් මෙන් යමෙකුට පරිහරණයට හෝ ආහාරයට ගැනිමට දීම සත්පුරුෂ ක්‍රියාවක් නොවේ."**

ඔබ ඉන්නා තැන සිට ඈතට විසිකිරීමෙන් වැලිගොඩවල් වලට හෝ ගහක මුලට හැලීම සුදුසු නැත. තිරිසනෙකුට වුව ආහාරයක් දිය යුත්තේ අනුකම්පාවෙනි.

## 3. සියතින් නොදීම

යම් කිසි කෙනෙකු දානයක් පිළියෙල කර නිවසෙහි සිටින මෙහෙකාර කොළුවා අත හෝ වෙනත් පිටස්තර කෙනෙකු මඟින් හෝ විහාරස්ථානයේම සේවය කරන පුද්ගලයන්ට පණිවිඩ යවා ගෙන්වා ගෙන දානය යැවිම සත්පුරුෂ ක්‍රියාවක් නොවේ. එය අසත්පුරුෂ දානයට ඇතුළත් වේ.

දානය පිළියෙළ කර සියතින්ම පිරිසිදු සිතකින් යුතව පිළිගැන්වීමට උත්සහගන්න. කොතරම් දුර බැහැර වුව මොන වැඩක් තිබුණත් ඔබ දෙන්නේ දානයක් නම් සැදැහැ සිතකින් යුතුවම පිළිගන්වන්න. එයයි නියම වූ දානය. ඉන් ඔබට මහානිසංස ලැබිය හැක.

## 4. ඉවත දමන්නාක් මෙන් දීම

දානය නැමති උතුම් ක්‍රියාවෙහි නියැලෙන ඔබ ශ්‍රද්ධාවෙන් යුතුව මහා කරුණාවෙන් එය කළ යුතුය. එසේ නෙමෙැතිව ඔබට පාවිච්චියට ගත නොහැකි දෙයක් ඉවත දමන්නාක් මෙන් යමෙකුට පරිහරණයට හෝ ආහාරයට ගැනිමට දීම සත්පුරුෂ ක්‍රියාවක් නොවේ. නරක් වූ ආහාරයක් යමෙකුට නොදිය යුතුය. යාචකයෙකුට ආහාරයක් වේලක් දෙන අවස්ථාවක වුවත් අනුභව කළ හැකි ආහාරයක් පිඟානකට බෙදා එයට අවශ්‍ය පමණට ව්‍යඤ්ජනද බෙදා බීමට දිය බඳුනක්ද සමඟ දෙන්න. එසේ කිරීමට නම් ප්‍රථමයෙන්ම ඔබේ සිත තුළ අනුකම්පාව, කරුණාව, දයාව තිබිය යුතුය. එවිට කුස ගින්නේ සිටින තැනැත්තා ආහාර ගන්න අයුරු දකින ඔබට අප්‍රමාණ සතුටක් දැනෙනු ඇත. ඔබ කළ ක්‍රියාවේ උපරිම ප්‍රතිඵල ඔබට ලැබෙනු ඇත. සතෙකුට දෙන ආහාරයක් වූවත් හොඳින් මිශ්‍රකර ලෑල්ලකට හෝ භාජනයකට දමා දීමට පුරුදු වන්න. ඒ මන්ද යත් සතාට ඔහුගේ ආහාරය මිශ්‍රකර අනා ගැනිමට නොහැකිය. එසේ නොදෙන විට ඒවා අසත්පුරුෂ දාන ගණයට වැටෙනු ඇත.

## 5. කර්මපල ඇදහිමෙන් තොරව දීම

විවිධ වූ පුද්ගලයන් විවිධ පරමාර්ථ ඉටුකර ගැනිමට දන්දීම කරති. කීර්ති ප්‍රශංසා ලැබීමට, උදව් උපකාර ලැබීමට, ප්‍රසිද්ධිය ලබා ගැනීමට සහ අන්අය අභිබවා යාමට සිටින අය අතරේ පරලොව සුගතියක් ලබාගැනිමට එනම් මතු උපදින ආත්මවල සා පිපාසාවක් නොමැතිව යස ඉසුරු සම්පත් ලබාගැනීමට දන්දෙන අයද වෙති. තවත් කොටසක් තමන් තුළ ඇති ආශාව ලෝභය තුනීකර ගැනිමටත් එමඟින් නිවන් මාර්ගය අවබෝධ කර ගැනීමටද පිවිසීමක් වශයෙන් දන්දීම කරති. එසේ ලෞකික ලෝකෝත්තර ලාභ ලබාගැනීම පිණිස දන්දීම කර්මඵල ඇදහිමේ ගණයට අයත් වේ. එසේ නොමැතිව දන්දීම අසත්පුරුෂ දාන ගනයට අයත් වේ.

ඒවගේම තමන් පරිභෝජනය කරන ආකාරයට වඩා පහත් ලෙස කරන පරිත්‍යාග දාන කරන තැනැත්තා දාස දාන දායකයෙක් වේ.

තමන් පරිභෝජනය කරන ආකාරයටම කිසිවක් අඩු හෝ වැඩි නොකොට දෙන තැනැත්තා දාන දායකයෙක් වේ. තමා පරිභෝජනය කරන අකාරයට වඩා ඊට හාත්පසින්ම වෙනස් අන්දමට පිළිවෙලට ප්‍රණීතව මනාලස දන්දිම ධානපති දායකයාගේ ලක්‍ෂණයකි.

ඔබත් මේ වනතෙක් දන් දිම් කළ තැනැත්තෙක් නම් ඔබ ඔබේ හදතට තට්ටු කර බලා ගන්න. ඔබ මේ දාන අතුරෙන් මොන ස්ථානයේ සිටින්නේද කියා ඔබටම ඔබ ගැන අවංකව සතුටු විය හැකිනම් අන්අය මොනවා කීවත් ඔබට කම් නැත. ඔබ ගැන ඔබට අවංකව සතුටුවිය නොහැකි නම් ලෝකයාම ඔබ ගැන වර්ණනා කළත් එයින් ඵලක් නැත.

ලලිතා හෙට්ටිආරච්චි
දේවහුව

# ධර්ම දේශනාවක

## අගය වටිනා ගනිමු



**මහින්දාගමනයෙන් පසු ධර්මද්වීපයක් බවට පත් අපේ රට නිවුණු සැනසුණ මානව ශිෂ්ඨාචාරයකට හිමිකම් කියූ බව ඉතිහාසය කියා දෙයි. අවංක හදවතින්ම සැදැහැ සිත් උපදවා සම්මා දිට්ඨියෙන් " විමසා බැලුව හොත් අතීතයේ ඇසෙන ඒ අභිමානවත් පණිවුඩය බණ පදයක් මිස අන් දෙයක් නොවේ. නිසල සිතකින් සසල කළ ගල් කටුවකින් අසල තිබූ ගල් තලිපකින් නිසසල සමාධි ගුණ වැගිරෙන බුදු රුවක් මවන්නට ගල් වඩුවා සමත් වූයේ හෙළ බණ පද වලින් ලද කුසල බලයෙන් මිස ලාබයට ලෝබයෙන් දූෂිත සිතින් නොවී.**

එදා මෙදා තුර අපට ඇහෙන බණ පද සහ අප විසින් අසනු ලබන බණ පද අප ජන සමාජයට කර ඇති බලපෑම් කෙබඳු දැයි සිතිය යුතු කාලය එළැඹ තිබේ. මතක බණ, හත්දොහේ බණ, කඨින බණ, පොහෝදා බණ, කවි බණ, යක් බණ, යුගාසන බණ, ආදී මෙකී නොකී ධර්මදේශනා ක්‍රම අපගේ ජනසමාජයේ සංස්කෘතික උරුමයක් ලෙස ස්ථාපිත වී තිබේ.

> **" බුදුබණ ඇසුවත් නිරන්තරේ**
> **බුදුබණ කීවත් නිරන්තරේ**
> **ගතිගුණ අතින් අපි තවමත්**
> **වනන්තරේ.......වනන්තරේ..."**

යනුවෙන් රඹුක්කන සිද්ධාර්ථ හාමුදුරුවෝ ගී පදයක සඳහන් කළත් මගේ නම් හැඟීම ඊට වඩා වෙනත් පැත්තක්, මේ වාණිජ සමාජ ක්‍රමය තුළ සල්ලි වලින් සැප සොයන, ආත්මාර්ථය පරම චින්තනය කොටගත් අවස්ථාවාදී මිනිසුන්ගේ මායාකාරී මවා පෙන්වීම් වලින් මත් වූ අහිංසක මිනිසුන් මේ තරම් වත් ආරක්ෂා වී ඇත්තේ මේ තරම් බණ කියන නිසා යැයි මට සිතේ. බණ පිරිත් පිංකම් පවා ප්‍රිය සාදයක් බවට දහම් පදවල යථාර්ථවාදී සත්‍ය රසය දිව ඔසුවක් කොටගෙන නන් මිත්‍යාවන් පරාජය කරමින් සිටිති.

මානව චින්තනයට යහ මඟක් නිර්මාණය කර දුන් නිර්වාණ මාර්ගය දේශනා කළ බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනා ක්‍රම කීපයක්ම භාවිතා කොට ඇත. ඒවානම් මෙසේය,

**1. බුද්ධො සෝ භගවා බෝධාය ධම්මං දේසේති.**

**(බුදුන් වහන්සේ ප්‍රථමයෙන් ධර්මය අවබෝධකර ගෙන දෙවනුව ලෝකසත්වයාට අවබෝධ කිරීමට ධර්මය දේශනා කරති.**

**2. දන්තෝ සෝ භගවා දමථාය ධම්මං දේසේති.**

**(ප්‍රථමයෙන් දමනය වූ බුදුන් වහන්සේ දෙවනුව ලෝකසත්වයාට දමනය පිණිස ධර්මය දේශනා කරති)**

**3. සන්තෝ සෝ භගවා සමථාය ධම්මං දේසේති.**

**(ප්‍රථමයෙන් ශාන්ත බවට පත වූ බුදුන් වහන්සේ දෙවනුව ලෝකසත්වයා ශාන්ත බවට පත් කරනු පිණිස ධර්මය දේශනා කරති)**

**4. තිණ්ණෝ සෝ භගවා තරණාය ධම්මං දේසේති.**

**(සංසාරය තරණය කර නිමවා වදාළ බුදුන් වහන්සේ ලෝකසත්වයාද තරණය කරවනු පිණිස ධර්මය දේශනා කරති.)**

> අද පැවැත්වෙන ප්‍රදර්ශනාත්මක ධර්ම දේශනා ක්‍රම මඟින් ප්‍රයෝජන ලබාගන්නේ ඉතා අල්ප කොටසකි.. ශ්‍රාවකයන්ගේ මනස අඳුරෙන් ආලෝකයට පුබුදුවා ගත හැකි විනාඩි ගණනක් හෝ එම දේශනා කාලය තුළින් අපට වෙන් කරගත හැකි නම් බුදු බණ පදයක් අසිරියෙන් අපගේ ජීවිත සිරිමත් කරගත හැකිය.

මෙමඟින් පැහැදිලි වන ප්‍රධානතම කරුණ වන්නේ අනුන් සඳහා දේශනා කරන සෑම බණ පදයකම එය තමන් දැන දැක පසක් කරගත් බවට සහතිකයක් තිබිය යුතු බවයි. අනුන් සුවපත් කරන්නට දේශනා කරන බණ පදය තමන් සුවපත් කළ ඔසුවක් ලෙස පෙන්වා දිය හැකිනම් ඒ දේශකයාණෝ පරමාදර්ශී තැනැත්තෙකි. එසේම ධර්ම දේශකයාණන් වහන්සේ නමක් තුළ පැවතිය යුතු තවත් ප්‍රතිපත්තිමය ගුණාංග පහක් සම්බුද්ධ දේශනාවේ සඳහන්ය. එනම්,

**1. ආනුපබ්බී කථං කථෙස්සාමිති ධම්මෝ දේසිතබ්බෝ**

**(අවුලෙන් තොරව පිළිවෙලක් ඇති කථාවක් කරමියි, ධර්මය දේශනා කළ යුතුයි)**

**2. පරියාය කථං කථෙස්සාමී,තී ධම්මෝ දේසිතබ්බෝ**

**(ඒ ඒ කරුණු එසේ වීමට හේතුදක්වමින් සුදුසු කතාවක් කරමී යනුවෙන් ධර්මය දේශනා කළ යුතුයි)**

**3. අනුද්දයතං පටිච්ච කථං කථෙස්සාමී,ති ධම්මෝ දේසිතබ්බෝ**

**(දුකටපත් සත්වයන් දුකින් මුදවීම යැයි කුළුණෙන් තෙත් වූ හදවතින් ධර්මය දේශනා කළ යුතුය.)**

**4. ආමිසන්තරෝ කථං කථෙස්සාමී,ති ධම්මෝ දේසිතබ්බෝ**

**(සිව්පස හෝ කීර්ති ප්‍රශංසා ආදී ආමිෂයක් ලබමී යන බලාපොරොත්තුව නැතිව ධර්මය දේශනා කළ යුතුය)**

**5. අත්තාං පරං අනුපහච්ච කථං කථෙස්සාමී,ති ධම්මෝ දේසිතබ්බෝ**

**(තමන් හුවා දැක්වීමට හෝ අනුන් පහත් කොට සැළකීමට නොව අනුන්ගුණ නොනසන කතාවක් කරමී යන අරමුණෙන් ධර්මය දේශනා කළ යුතුය.)**

මෙම කරුණු නොසලකා හැර ධර්මය දේශනා කරන දේශකයාණන් වහන්සේ නියම දේශකයෙකු නොවන බව සැළකිය යුතුයි.

ධර්ම දේශනාවක කාලය අපේ රටේ නම් පැයක් හෝ විනාඩි 45 ක් සීමා වී ඇත්තේ ගුවන් විදුලි ධර්මදේශනා ආරම්භ වූ පසුවයි. එසේ නොමැති නම් එහි කාල නිර්ණය තීරණය විය යුත්තේ දේශකයාණෝ පැහැදිළි කර දීමට සූදානම් වූ දහම් කරුණු පැහැදිළිකර අවසන් වූ කාලයයි. එසේත් නැතිනම් ශ්‍රාවකයා එය තේරුම් ගෙන අවසන් වූ කාලයයි. උපත්ස්ස පරිබ්‍රාජකයාණන් අස්සජි හිමියන්ගෙන් ශ්‍රවණය කළේ ගාථා පද හතරක් පමණි. එයින් මුල් පද දෙකක ශ්‍රවණය කරත්ම හෙතෙම සෝවාන් වූ බවක් සඳහන් වෙයි. මේ අනුව අප නිගමනය කළ යුත්තේ ධර්ම දේශනාවක වටිනාකම රැඳී ඇත්තේ ඉදිරිපත් වන කරුණු හා තේරුම් ගන්නා කරුණු අතර ඇති සම්බන්ධතාවය මත බවයි.

අද පැවැත්වෙන ප්‍රදර්ශනාත්මක ධර්ම දේශනා ක්‍රම මඟින් ප්‍රයෝජන ලබාගන්නේ ඉතා අල්ප කොටසකි. ශ්‍රාවකයන් මනස අඳුරෙන් ආලෝකයට පුබුදුවා ගත හැකි විනාඩි ගණනක් එම දේශනා කාලය තුළ අපට වෙන් කර ගත හැකි නම්, බුදු බණ පදයක අසිරියෙන් අපගේ ජීවිත සිරිමත් කරගත හැකිය. ගැඹුරු දහම් පද වියතුන් සභා මැද පමණක් දේශනා කොට සාමාන්‍ය ජනතාව අතර සැමට වැටහෙන සරළ බස් වහරකින් සිය දේශනාවන් පැවැත්වීම දේශකයාණන් වහන්සේලාගේ වගකීමක් වන අතර දේශක ගෞරවය රැකගෙන සම්ප්‍රදායන් තුළ පවතින හරයන්කද බිඳ නොහැර නැණ නුවන් වඩවා ගැනීමේ අරමුණ පෙරදැරිව ධර්ම ශ්‍රවණය කිරීම ශ්‍රාවකයන්ගේද යුතුකමකි.

සාමවිනිසුරු ශාස්ත්‍රපති වික්‍රමසිංහ අතපත්තු
තලවත්තේගෙදර.

රංගිරි ශ්‍රී ලංකා RSL NEWSPAPER

රංගිරි - ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය
රංගිරි දඹුල්ල සංවර්ධන පදනම,
අංක 130, දඹුල්ල.

දුරකථනය: 066-2283606 (දිගුව 161) හෝ 071 5361328
ෆැක්ස්: 066-2284603
ඊමේල්: rangirinewspapers@gmail.com
වෙබ් අඩවිය: www.rangirisrilanka.lk

## සදහම් සමාජයක් බිහිකිරීමට කැපවෙමු.

සම්බුදු හිමිගේ සඳහම් සිසිලෙන් සැනහෙන අපි සිරි ලක් දරුවෝ... දහම් පාසලේ සෙවනෙහි වැඩෙමින් - උදාර ගුණදම් සිත දැරුවෝ... යන සොඳුරු ගීතය සෑම ඉරු දිනෙකම පාහේ මෙරට බොහෝ විහාරස්ථානවල කියැවෙති. මෙරට වර්තමාන වැඩිහිටි බෞද්ධයන්ගෙන් වැඩි දෙනෙකු ද මෙම ගීතය එක්වරක් හෝ ගායනා කර තිබිය හැකිය.

සෝමපාල රාජකරුණා සූරින් විසින් රචිත මෙම ගීතය මෙරට ළමා පරපුරේ උදාරතම තේමා ගීතය ලෙස හැඳින්විය හැකිය. බෝසත් දරුවකු තුළ තිබිය යුතු දැනුම ආකල්ප සහ කුසලතා මෙන්ම ආචාර ධර්ම රැසද මෙම ගීයෙන් හොඳින් විස්තර වෙයි.

මෙවන් ගීතයක පිවය ලැබෙන්නේ දහම් පාසල් අධ්‍යාපනය නිසි ලෙස සපුරාලීමෙන් පමණකි. දහම් අධ්‍යාපනය ලද දරුවෝ සැබවින්ම නිවුණු දරුවෝ වනබව අවස්ථා ගණනාවකදීම ඔප්පු වී තිබේ. මෙරට ඇතිවු තරුණ අසහනය පිළිබඳ කොමිෂමක සඳහන් වන්නේ නිසි දහම් අධ්‍යාපනය ලද දරුවන් කළකෝලාහල වලට පවා මැදිහත් වී නැති බවය. ඔවුහු සමාජ ප්‍රශ්න ධර්මානුකූලව විමසා බලා බුද්ධිමත්ව තීරණ තීන්දු ගැනීමේ ආභාසය දහම් අධ්‍යාපනයෙන් ලබා ගනිති.

මෙරට වත්මන් පාසල් ශිෂ්‍ය සංඛ්‍යාව 40 ලක්‍ෂයකට ආසන්නය. නමුත් මින් දහම් අධ්‍යාපනයට යොමුව සිටින්නේ ඉතා අල්ප ප්‍රමාණයක් බව සංඛ්‍යා ලේඛන දක්වයි. බෞද්ධයින්ට මෙන්ම අන්‍ය ආගම් විසින් ද ඉරුදින දහම් අධ්‍යාපනය ලබාදෙනු ලබයි. නමුත් කලින් කළ ක්‍රමයෙන් වර්ධනය වූ පෞද්ගලික පන්ති ව්‍යාපාරය විසින් මෙරට දහම් අධ්‍යාපනයට දැඩි බලපෑම් එල්ල කර ඇත. මෙරට පවතින ප්‍රධාන විභාග තුනෙහි තරඟකාරීත්වය විසින් ළමුන් දහම් අධ්‍යාපනයෙන් ඈත්කර දමනු ලබයි.

මේ තත්වයට විසඳුම් ඉල්ලා සංවිධාන මෙන්ම පුද්ගලික වශයෙන්ද දිගින් දිගටම ඉල්ලීම් කෙරෙතත් දහම් පාසල් අධ්‍යාපනය නඟාසිටුවීම පිණිස විධිමත් වැඩසටහනක් දියත් කළ යුතු බව මෙරට දහම් අධ්‍යාපනය මූණ දී ඇති ගැටළු දෙස බැලීමේදි ප්‍රත්‍යක්‍ෂ වෙයි.

වර්තමාන සමාජය අතීත අධ්‍යාපනයේ කැඩපතකි. වර්තමාන තරුණ පරපුර සහ සිසු පරපුරේ හැසිරීම් රටාව මගින් ප්‍රකාශ වන්නේ අනාගත සමාජයේ හැඩරුවය. එකී චිත්‍රය එතරම් විචිත්‍රවත් නොවන බව දිනපතා අසන්නට දකින්නට ලැබෙන දෙයින් පෙනෙන්නට තිබේ. දේශපාලනයෙන් මෙන්ම සංස්කෘතික වශයෙන්ද මෙරට තරුණ පරපුර අවිනිශ්චිත දිශානතියක් කරා ගෙනයන බවක් පෙනෙන්නට තිබේ.

ගුණවත් නැණවත් අර්ථසම්පන්න අනාගත පරපුරක් ප්‍රාර්ථනා කරන සැවොම මෙරට දහම් අධ්‍යාපනය පිළිබඳව විමසා බැලීම අත්‍යවශ්‍යය.

දහම් පාසල් අධ්‍යාපනය පවත්වාගෙන යනු පිණිස උපකාර සහ සහන රැසක් දැනට ද ක්‍රියාත්මක බව අපි දනිමු.

නමුත් කාලෝචිතව සිදුවිය යුතු අධ්‍යාපනික වෙනස්කම් සිදුකිරීම, තොරතුරු තාක්‍ෂණයේ උපකාර ලබාදීම දහම් පාසල්වල භෞතික හා මානව සම්පත පෝෂණය කිරීම දහම් අධ්‍යාපනයේ ඇති නැති පරතරය අවම කිරීම දහම් පාසල් නොපවතින ප්‍රදේශ වලට විකල්පීය පහසුකම් ඇතිකිරීම මෙන්ම විශේෂයෙන් ඉරිදා උදේ වරුව වත් දහම් අධ්‍යාපනය ලැබීමට මෙරට දරුවන්ට ඉඩකඩ වෙන්කර දීම යන කාරණා පිළිබඳව නැවත විමර්ෂණයක් සිදුකළ යුතුය.

ජාත්‍යන්තර වෙසක් උළෙල මෙරට පවත්වන මෙම වර්ෂයේ දහම් අධ්‍යාපනය සඳහා ජාතික වැඩපිළිවෙලක් අරඹන්නේ නම් එය බුදු සසුනේ පෝෂණය සඳහා ගනු ලබන උසස්ම ක්‍රියාමාර්ගය වන්නේය.

## ගෞතම සම්බුදුපියාණෝ ප්‍රවේණි වංශ චාරිත්‍රයට ගමන් ඇරඹූ මැදින් පුන් පොහොය



මැදින් මස පුර පසළොස්වක පොහොය දිනය සම්බුද්ධ ශාසන ඉතිහාසයේ අතිශය උදාර දිනයකි. ඒ උදාරත්වයට හේතුවන සුවිශේෂි කරුණු දෙකකි.

1. සම්මාසම්බුදු රජාණන් වහන්සේ සම්බුද්ධත්වයෙන් මාස දහයක් සම්පූර්ණ වන දින පිය මහරජතුමන් ප්‍රමුඛ ඥාතීන්ට ධර්ම දේශනා කිරීම සඳහා කිඹුලුවතට වැඩීම.

2. බුද්ධත්වයෙන් වසර පහක් පමණ ඉක්මෙන මැදින් පුන් පොහෝ දින ප්‍රජාපතී ගෝතමී දේවිය ඇතුළු 500ක් රාජ කුමාරිකාවෝ පැවැද්ද අපේක්‍ෂාවෙන් ගමන් ඇරඹීම.

ඉහත කරුණු දවස හේතුවෙන් බොහෝ සත්වයාට සෙත ශාන්තිය සැළසුනි. දස දහස් සත්වයෝ අමාමහ නිවන් දුටුහ.

බෝසතාණන් වහන්සේ ගිහිගෙය හැරපියා ගොස් සකළ ක්ලේෂයන් දුරුකළ බැවින් අතීතයේ වූ සියළු බැඳීම් සිඳහල ද පුත්‍ර ස්නේහයෙන් පිඩිත වූ සුදෝවුන් මහරජතුමා සිය පුතු අද අද වඩීවි යැයි සිතා පෙරමඟ බලා සිටියේය.

එහෙත් සිදුහත් කුමරු ගිහිගෙයින් නික්ම වසර 7කට ද ආසන්න විය. බුදුරදුන් වඩමවාගෙන ඒම සඳහා නව වරකදී ඇමතිවරු නව දෙනෙක් පිරිස සමඟ පිටත් කළද ඒ සියළු දෙනා පැවදි වූවා මිස බුදුරදුන් රැගෙන නොවැඩියහ.

දසවෙනි වතාවට සිදුහත් කුමරු හා එකදින උපන් කළුදායි අමාත්‍යවරයා අමතා පුත කළුදායි, මා පුතු හමුවට ගොස් සුදෝවුන් මහරජාණන් පුතු නොදැකීමේ ශෝකයෙන් පසුවන බව පවසා කෙසේ හෝ මාපුතු කැඳවාගෙන එවයි" කීය.

මහරජාණන් වහන්ස, පැවදි වන්නට අවසර දෙන්නේ නම් පැවදිව සම්බුද්ධ පියාණන් ද වැඩමවා ගෙන එන්නෙමි" ය කළුදායි ඇමති පැවසීය.

සුදෝවුන් මහරජතුමාගේ අවසරයෙන් සම්බුද්ධ හිමියන් එවකට වැඩසිටි රජගහ නුවර වේළුවනාරාමයට ගිය කළුදායි ඇමති ප්‍රමුඛ පිරිස ලොව්තුරා සම්බුදුන්ගෙන් ධර්මය ශ්‍රවනයෙන් පසු එහිභික්ඛු" ප්‍රව්‍රජ්ජාවෙන් මහණ උපසම්පදාවී මහරහත් භාවය ලැබීය.

පොරොන්දු ඉටු කිරීම මහා සත්පුරුෂ ගුණාංගයකි. ලෝකෝත්තර සුවයෙන් සුවපත් වූ කළුදායි මහරහතන් වහන්සේ සුදුසු කාලය බලා වස්සානය උදාවූ මැදින් පුර පසළොස්වක පොහොය ඉදිරියේ තිබියදී සම්මා සම්බුදුරජාණන් වහන්සේ වෙත වැඩමවා, රජගහ නුවර වේළුවනාරාමයේ සිට කිඹුල්වතට වඩින මාර්ගය පිළිබඳවත්, සුදෝවුන් රජමාළිගය පිළිබඳවත්, සුදෝවුන් රජතුමාගේ ඉල්ලිම පිළිබඳවත් ගාථා 60 කින් වර්ණනාත්මකව දේශනා කළේය.

මෙම ආරාධනයෙන් පසු සර්වඥතා ඥනයට සමවැදී බුදුපියාණෝ පෙරත් සම්බුදුවරු ප්‍රවේණි වංශ චාරිත්‍රය" ඉටුකර ඇති බව දැක දෙපාර්ශවයේම ඥාතීන්ට ධර්මයෙන් සංග්‍රහා කිරීම පිණිස විසිදහසක් රහතන් වහන්සේලා පිරිවරා සැට යොදුනක් මඟ ගෙවා කිඹුල්වතට වැඩම කිරීම ආරම්භ කළේ මැදින් පුර පසළොස්වක පෝය දිනකදීය. මෙම වැඩමවීමෙන් ලැබුණ ප්‍රතිඵල අනන්තය.1. මානයෙන් යුක්ත වූ ශාක්‍යයන්ගේ මානය බිඳීම.

2. සම්බුදු පියාණෝය යමහාමහ ප්‍රාතිහාර්ය පෑම.
3. සුදෝවුන් රජතුමා සිය පුතුට තුන්වන වැඳුම වැඳිම.
4. සුදෝවුන් රජතුමා ඇතුළු ශාක්‍යයන් මාර්ගඵල අවබෝධ කරගැනිම.
5. වෙස්සන්තර ජාතකය දේශනා කිරීම
6. සුදෝවුන් රජතුමා ප්‍රමුඛ ශාක්‍යයන බුදුන් ප්‍රමුඛ සංඝයාට නිග්‍රෝධාරාමය පූජාකොට අටමහා කුසලයක් සිදු කර ගැනිම.
7. සුදෝවුන් රජතුමාට බුද්ධ වංශය" පැහැදිළි කොට උට්ඨාන වීර්යයත්,නොපමාවෙහි අගයත්, ධර්මයේ හැසීරීමත් ආදී දහම් දෙසා සෝවාන් ඵලයෙහි පිහිටු විම.
8. නන්ද රාහුල ආදී කුමාරවරුන් පැවදි කරවා අමාමහ නිවනට පැමිණ වීම.
9. ශාක්‍ය කෝලිය යුද්ධය ඇති වීමට ඉඩ නොදී දෙපාර්ෂවයටම ධර්මාවබෝධය ලබා දී පන්සියයකට අධික පිරිස මහණ උපසම්පදා කරවා නිවනින් සැනසීම.
10. දෙමාපියන්ගේ අනුදැනුමෙන් පමණක් කුල දරුවන් පැවිදි කිරිමට විනය නීතියක් පැනවීම.
11. බුද්ධත්වයෙන් වසර පහක් ගතවෙන මැදින් පුන්පොහෝ දින එදා සෝවන් ඵලයෙහි පිහිටි මහා ප්‍රජාපතී ගෝතමී දේවිය ඇතුළු පන්සියයක් රාජ කුමාරිකාවෝ මහණකම ඉල්ලා විශාලා මහනුවර කූටාගාර ශාලාව වෙත ගමන් ඇරඹීම.
12. ඒ හේතුවෙන් එදා මෙදා තුර කාන්තාව මෙලොව පරලොව ලෞකික ලෝකෝත්තර සැනසීම ලැබීම.
13. මෙහෙණි සමාජය ආරම්භ වීම නිසා ශ්‍රී සම්බුද්ධ ශාසනයේ සිව්වනක් පිරිස සම්පූර්ණ විම.
14. බුදුරජාණන් වහන්සේ ලබාදුන් කාන්තා නිදහස මෙහෙණි සමාජය ආරම්භ වීමෙන් යථාර්ථවත් විම.

සම්මා සම්බුදු රජාණන් වහන්සේ කිඹුල්වතට වැඩමවිම හා මෙහෙණි සමාජය ආරම්භ වීමට අදාළ මූලික පියවර තැබීම හේතුවෙන් ඉහත සඳහන් සියළු ප්‍රතිඵල නෙලා ගැනීමට හැකිවිය. මේ සියළු යහපත් කාර්යයන්ට මූලිකත්වය ලද මැදින් පුන් පොහාය බෞද්ධ ජනතාවට අතිශයින්ම වැදගත් වන්නේය.

පූජ්‍ය වත්තේගම
කුසලධම්මා මෙහෙණිය.

# සඳ සිසිල

සංස්කාරක
"සඳ සිසිල"
රංගිරි ශ්‍රී ලංකා පුවත්පත
අංක 130,
නුවර පාර,
දඹුල්ල.

## ජය සිරිමා බෝධී....

අපමන ලෝ සත
සසරින් ගලවා
නිවනට මඟ පෑදූ
නොපමාවී වැඳ
දොහොත් මුදුන්දී
තිලො අඟ මෑනී සාදූ
ලුම්බිණි සල් උයනේදී බිහිවී
වෙසගේ පුන් පෝදා
පැවසී මුලු ලොව
අගතැන් වෙන බව....
ලොවටම වැඩ සාදා
දස මාර සේනා බිඳ
පලවාහැර
ජය සිරිමා බෝධී.........

ඩබ්. එම්. පී. විජේසිංහ
ගල්නෑව

## කඩුපුල් මල්.........

මැදියම් රෑ අඩ අඳුරේ
ශ්වේත වර්ණ කඩුපුල්මල පිපුණා
හෙමින් හෙමින් සුවඳ විදු
පෙති මැලවී හකුලාගෙන
රොන් සුණු තුරුලෙම රඳවා
හිරු නැග එන්නට කලියෙන්
ලොව අනියත බව පළකොට
නටුවෙන් ගිලිහී හෙමිහිට
මිහිලිය තුරුලට වැටුණා

යූ.බී. දිසානායක
මලව-කැකැරාව

## අමිල නිමල සෑසි පියේ...

අන්න බලන් ගඟන තලෙන්
සරා සඳේ රැස් පෙරුණා...
බුදු කරුණා අමා ගඟුල
දුක් සෝ සිඳ රැළි නැගුණා...

වසත් සමේ දහස් ගණන්
සුවඳ සුමුදු මල් පිපුණා...
මුණි සිරිපා පියුම වටා
ඒ මල් දෝතින් පිදුණා...

අමිල නිමල සෑසි පියේ
දෙසූ දහම් පද අසනා...
දුකින් තැවුන මා හදවත
පියුමක් සේ පුබුදු වුණා...

එම්. සිරිධම්මාචාරි
මෙහෙණින් වහන්සේ
පොල්පිගම

## වස්සානය

තෙලි තුඩට හසුවුණු
සිත්තමක්
සේ.....
නුඹ වාගේම හිනැහෙයි....
දිය කෙලින පුංචි මාළුවෝ
රමණීය වන ගැබෙහි.....
සන්නාලියනේ......
කෙසේනම් ඇන්දාද....
දේදුන්න.... අහස්කුස.....?
ගිම්හානයේ කෘෂව ගිය
ගංගාව......
වස්සානයේ.....
නුඹ නැවත පිරිපුන්ය....
ජීවිතය කටුක යැයි කියා
නො අතහැර යන්න....
හෙට දවස
ජීවත් කරන්නට....

අමාලි රුවන්තිකා
ඇහැලියගොඩ

## අපේ ඉස්කෝලේ

ජාතික ඇඳුම ඇද ගත්තු
ලොකු සර්ගේ අභිමානය
අත රැඳුණු වේවැලට අවනතව
හද්දා පිටිසර ගමක පරපුර
සරසවියට අවනත කළ,
අඩිවේගී නොවූ මල් මාවත දිගේ
කුරුල්ලන්ට ඔච්චම් කර කර
අපි ගියපු ඉස්කෝලේ
ගමේ ගුරු මෑණියන්ගේ
සාරියේ තිබූ සැවැන්දරා සුවඳට
ඉවකර දණ ගහගෙන හිටපු
කටපාඩම් බැරිවෙච්ච පංතිය
අපට ජීවිතේ කියාදුන් අකුරු තොටිල්ල
පන්ති කාමරය වැහිලා
ගේට්ටුව විතරක් කැඩිලා
හරක් රැනක් ඇතුල් වෙන අපූරුව
අන්න බස් පාර අයිනේ
පාට පාට ඉස්කෝල කඩයක් ඇරිලා
ඉංග්‍රීසියෙන් උගන්වනවා
සනුහරේටම වැරදිච්ච පාඩම......

වික්‍රමසිංහ අතපත්තු
තලවත්තේගෙදර

## මගේ පුතුට........

| | |
|---|---|
| වන මලින් ගෙනෙන මද | නල |
| ගෙන එන්නෙද මේ සිතට | සැනසුම |
| හිම කොදෙව් තුළින් ඇදෙන | නිල්දිය |
| පෙන දිදි රඟයි නොදැන මං | පෙත |
| | |
| හිරු අවර ගිරින් නැගෙයි | ලොවකට |
| එය අලුත් දිනකි පුතේ | සත්තට |
| බැසයන හිරු නැගෙන හිරක් ලෙසට | දුටුවට |
| හිරු එනනයි අපියි පුතේ යන්නේ | දුවදුව |
| | |
| වෙනස් වෙවී ගලා හැලෙන අපේ | ලෝකයේ |
| දෙමාපියන් හිරු සඳු ලෙස සිටී හැම | දිනේ |
| මව් කෙනෙකුගේ අගය දැනුන දිනක මගේ | පුතේ |
| පෙනී ඉන්න මා වෙනුවෙන් ස්ත්‍රී | පරපුරේ |
| | |
| පාරේ තොටේ බස් රථ වල යනෙන හැම | දිනේ |
| ඇයට නිදහසක් තිබේද කුරිරු | ලෝකයේ |
| හිංසා, පීඩන දූෂණ හැම | තැනේ |
| නුඹ වෙන්වී රැකවරණය වෙන්න සෑම | දිනේ |

එන්.එස්.මධුවන්ති
රත්නපුර.




## තුන්සිත

දෙතොලේ නෙක පාට උලා
නන් දොඩවන
මුව කුමටද.......
පෝය දාට සිල් ගන්නා
දුක නොදන්න
සිත කුමට ද.....
උදේ හවා බෙහෙත් ගිලින
වයසට යන
කය කුමට ද ......
ලොවෙ වැඩක් නැතිව ගෙවන
ඔබෙ මිනිසත් බව
කුමට ද.......

භාග්‍යා එම් හේරත්
කැකිරාව

**මාර්තු 08 ජගත් කාන්තා දිනය වෙනුවෙන්....**

# සිංහල වනිතාව සතු නිදහස

(1948 අගෝස්තු මස එක්තරා සඟරාවක පල වී තිබූ "සිංහල වනිතාව සහ නිදහස" නම් මෙම ලිපිය එදවසටත් වඩා අදට මොනතරම් උචිත ද යන්න පාඨක ඔබම තීරණය කරන්න.)

"සිංහල වනිතාව සම්බන්ධයෙන් අප රටේ පුවත්පත් වල විශේෂයෙන්ම සිංහල පුවත්පත් වල පළවන ලියුම්, සිංහල බවලත් සාමාන්‍ය ජනතාව දෙස බලා ලියනා ලද ලිපි නොවේ. ඒ හැම ලිපියක්ම පාහේ ඉංග්‍රීසි උගත් "සිංහල කුල කාන්තාවන්" දෙස බලා, මේ ලංකාවේ ඔවුන් හැර වෙන අන් සිංහල කුල කාන්තාවක හෝ ගැහැණියක නැත යන විමතියෙන් ලියන ලද ලිපිය. මේ සිංහල ජාතිය අද පවතින්නේ ඉංග්‍රීසි උගත් කළු ඉංග්‍රීසි කාරියන් කිහිප දෙන පිට නොවේ. සිංහල කාන්තා සමාජය අනෙකකි. ඉංග්‍රීසියෙන් බණ කියනු ලබන පිරිස අනෙකකි.



මේ ඉංග්‍රීසියක් නිසා අප රටේ ඇති වී තිබෙන පංති භේදය, කුල භේදයට ද වඩා නින්දිතය. සිංහල වනිතා පක්ෂයට ඉගෙන ගන්නට ඇත්තේ පියානෝ ගැසීමත්, නැටීමත්, ඇඳුම් පැළඳුම් කරන හැටි ගැන වාද කිරීමත් දේශපාලන වැඩ අතට ගැනීමත් බල්ලන් බළලුන් වැනි සතුනට සාත්තු සප්පායම් කරන සමිති පිහිටු වීමත් පමණ ද? මේවායේ යෙදෙමින් මේ ඉංගිරිසි උගත් සිංහල කාන්තාවන් බොහෝමයක් කරන්නේ පෙනුමට මිස ඇත්තටම එවැනි වැඩක් වත් නොවේ.

වනිතා පක්ෂය පුරුෂ පක්ෂය මෙන්ම රට පාලනය සම්බන්ධයෙන් ලොකු වගකීමකට බැඳී සිටිති. ඒ බැඳිමේ හැටියට ඔවුන්ගෙන් විය යුතු සේවයකට නොදෙන්නේ ඉංගිරිසි යයි. අනෙකක් තබා ඉංගිරිසි නැතිව සප්පායම් කාරියක වෙන්නට ගිය තැන දී ද ඇයට ලැබෙන නෙරෙක්කු අපමණයි.

එහෙයින් පුරුෂ පක්ෂයෙහි මෙන්ම ස්ත්‍රී පක්ෂයෙහි ද සිය රටේ දියුණුව වෙනුවෙන් උනන්දුවක් සිතේ ඇති වන්නට නම් මේ බොරු ඉංගිරිසියෙන් ඇති කරන භේදය වහා නතර කළ යුතුයි. මේ මැසිවිල්ල ඉංගිරිසි භාෂාව ගැන නොවෙයි. දැනුමට වගේම ජාතීන් අතර යාළු මිත්‍රකම් වලට ද ඉංගිරිසිය විතරක් නොවෙයි ඔය කොයි කොයි භාෂාවත් දැන ගැනීම අගෙයි.

"අපිලත් සිංහල තමයි. නමුත් අර පිටිහර නූගත් සිංහලියෝ නොවෙයි. අපිලට සිංහල කථාවත් බෑ, අපිලා

**" මේ මව්බිම වෙනුවෙන් දිවි පුදන්නෝ, ඔව්! මේ වී කොටන, දර පහින, ගොයම් කපන, රබන් ගහන, ඔංචිලි පදින නියම සිංහල ගැහැණියගේ ජව සම්පන්න දරුවනුයි, ඒ බිල්ලට යන්නේ. ඔවුනුයි වෙඩි බෙහෙත් හරි අඹරන්න යන්නෙ."**

ඔක්කොම ඉගෙන ගෙන තියෙනව. ඉංගිරිසි තමයි. අපිලට පියානෝ - වයලින් ගහන්න පුළුවනි. අපිලට රබන් තමයි ගහන්න බැරි. ඒවා පිටිහර සිංහල ගෑණිලා තමයි ගහනවා. අපිට හොඳට ඩාන්සින් දන්නවා. ෆැෂන් එකට ඉන්න දන්නවා. මේ ආදී වශයෙන් අභිමන් උපදවාගෙන වත්කම් ඇති ටික එහෙයින් පුරුෂ පක්ෂයෙහි මෙන්ම ස්ත්‍රී පක්ෂයෙහි ද සිය රටේ දියුණුව වෙනුවෙන් උනන්දුවක් සිතේ ඇති වන්නට නම් මේ බොරු ඉංගිරිසියෙන් ඇති කරන භේදය වහා නතර කළ යුතුයි. මේ මැසිවිල්ල ඉංගිරිසි භාෂාව ගැන නොවෙයි. දැනුමට වගේම ජාතීන් අතර යාළු මිත්‍රකම් වලට ද ඉංගිරිසිය විතරක් නොවෙයි ඔය කොයි කොයි භාෂාවත් දැන ගැනීම අගෙයි.


"අපිලත් සිංහල තමයි. නමුත් අර පිටිහර නූගත් සිංහලියෝ නොවෙයි. අපිලට සිංහල කථාවත් බෑ, අපිලා ඔක්කොම ඉගෙන ගෙන තියෙනව. ඉංගිරිසි තමයි. අපිලට පියානෝ - වයලින් ගහන්න පුළුවනි. අපිලට රබන් තමයි ගහන්න බැරි. ඒවා පිටිහර සිංහල ගෑණිලා තමයි ගහනවා. අපිට හොඳට ඩාන්සින් දන්නවා. ෆැෂන් එකට ඉන්න දන්නවා. මේ ආදී වශයෙන් අභිමන් උපදවාගෙන වත්කම් ඇති ටික දෙනෙකුට මොනර වෙසින් පසුවීම මේ රට ඉංගිරිසියට අයිතිව තිබුණු කාලේදි නම් පුළුවන් විය හැකි වුවත්, අද එවැන්නක් කළ නොහැකි බව, මොළය කළඳක් වත් තිබෙන්නියකට නම් පෙනිය යුතුය.

ඉස්සර නම් "අපට ඇති කාරිය මොකද? අපි ඔහේ තෙලේ බැදෙන කැවුම වාගේ නට නටා සිටිමු. අපේ රට පර සතුරන්ගෙන් බේරා ගැනීම, රෝග බයින් බේරා ගැනීම, සා දුකින් බේරා ගැනීම, අපව පාලනය කරන ඉංගිරිසි කාරයා සතුවෙද්දෙන්" යනුවෙන් සැනසී ඉන්නට තිබුණි. අපට "නිදහස ලැබුණා - ලැබුණා" කිය කියා අද අප කෙළ මතින් මත්ව සිටින කළු ඉංගිරිසිකාරියන්ට තවම තේරිලා නෑ. පර සතුරු බියකින් යුද්ධයක් වුණු දා ඔය ඉංගිරිසි වෙස් ගත් කළු ඉංගිරිසිකාර සයරෝග කාරයින්ගේ දරුවන් නොවෙයි.

මේ මව් බිම වෙනුවෙන් දිවි පුදන්නෝ, ඔව්! මේ වී කොටන, දර පහින, ගොයම් කපන, රබන් ගහන, ඔංචිලි පදින නියම සිංහල ගැහැණියගේ ජව සම්පන්න දරුනුයි, ඒ බිල්ලට යන්නේ. ඔවුනුයි වෙඩි බෙහෙත් හරි අඹරන්න යන්නෙ.


සිංහල ස්ත්‍රියට නිදහස ලැබිය යුතුයි. සිංහලෙන් රජයේ සියලු උසස් පදවි උසුලන්නට පවා නිදහස ලැබිය යුතුය. එසේ නැතිව ඉහළ පෙළේ කළු ඉංගිරිසිකාරියන් ටික දෙනෙකුට, කිසි වැදගැන්මකට නැති බොරු පෙනුමෙන් පමණක් සැරසී, ඉංගිරිසියෙන් අගය පෙන්ව - පෙන්වා නියම සිංහල ගැමි වනිතාවට උජාරු දක්වන්නට ඉඩ තැබීම, ජාතිය මතක් කරනු කැමැත්තෙමි.

**සැපයුවේ - භාග්‍යා හේරත් - කැකිරාව**



**ධර්ම දේශණා ශ්‍රවණය කිරීමෙන් ලබාගත් දැණුමින් සකස් කරන ලද්දකි.**

# සිත රැක ගනිමු....



කෙළවරක් නැති ක්ලේශ සමුදායක් සිත තුළ ජනිත වන්නේ සතියෙන් තමාගේ සිත දෙස බැලීමට නොහැකි නිසාය. කෙනෙකු ධර්මයෙන් පෝෂිත වෙද්දී හදවතෙහි එම ධර්ම දැරිය යුතුවේ. නිවන් දකින්නේ බාහිර ලෝකයක් නොව තමන්ගේ සිත දමනය කිරීමෙනි. සමතුලිත සිත රැකගැනීම තුළින් බාහිර බලපෑම් වලින් වැළකේ. මේ සඳහා යෝනිසෝ මනසිකාරය ඉදිරියටම පැවැත්විය යුතුයි. ඉන්ද්‍රිය අසංවරය හැම මොහොතකම නිවන් මඟට බාධාවක් බවක් ඉන්ද්‍රිය සංවරය ඉතාම ඉක්මණින්ම සමාධි ගතවීමට බලපාන බවත් බුදුරජාණන් වහන්සේ දේශන කර ඇත.

තමන්ගේ සිත තුළ කෙළෙස් එකින් එකට ගිලිහී යන අයුරු තමාට ම අවබෝධ විය යුතුය. මුළු ආර්ය අෂ්ටාංගික මාර්ගයම වැඩෙන්නේ තමසිත තුළය. තුණුරුවන් (ත්‍රිවිධ රත්නයම) වැඩ සිටින්නේ තමාගේ හදවත නැමැති පූජාසනය තුළය. එහි පිරිසිදු බව දන්නේ වෙනත් අයකු නොව තමන්ම පමණි. මෙය සන්සුන් ගමනකින් විමුක්තිය ඉලක්ක කොට යා යුතු ගමනකි. එම ගමනාන්තය ශාන්ත වූත්, නිරාමිස වූත්, හිස්වූත්,සියල්ලෙන්ම නිදහස්වූත්, ක්ෂේම භූමියෙකි.

**ඒ.මුණසිංහ**
**අනුරාධපුර**

# විශ්මිත විශ්වය

මිනිසා සොබා දහමේ විශිෂ්ට නිර්මාණයකැයි ආදි ග්‍රීක චින්තකයෝ උධෘත කළහ.

දේව අනුහසකින් මිනිසා පහළ නොවූ බව කී බුද්ධිමතුන් එදා අධර්මාධිකරණය විසින් ඝාතනය කළේය.

පරිණාමවාදයට අනුව මිනිසා සකස් වූයේ වානර විශේෂයකින් බව මානව විද්‍යාඥචාර්ල්ස් ඩාවින් (ක්‍රි.ව. 1802 - 1882) ඔප්පු කළේය.

දැන් මතකය අලුත් කරගෙන ඔබ මෙතෙක් කියපු දේ ගැන මෙනෙහි කරන්න. මතක ද ඔබට!

අපි විශ්වය ගැන කතා කළෙමු.

විශ්වය ශූන්‍ය අන්ධකාර ආගාධයකි.!

සෞරග්‍රහ මණ්ඩලය ගැන සොයා බැලුවෙමු.

ගිනිගෙන දිළිසෙන මහා යෝධයා - හිරු - පෘථිවය... මතක ද? පෘථිවිය හිරුගේම කැබැල්ලකින් සෑදුන කුඩා ග්‍රහ ගෝලයක්. පෘථිවියේ ප්‍රථම විප්ලවය.. වර්ෂාව... ඊළඟට ඒක සෛලික ආරම්භක ජීවය හට ගැනීම.. පළමු ශාක පද්ධතිය.. මහා පොළොවේ කඳු .. මිටියාවත්.. පස...


අප මේ කතා කරන්නේ ඔබ විද්‍යාත්මක වශයෙන් මහා දැනුමැත්තෙකු කරවීමට නොවේ. අප හැම දෙනාම අප ගැන දැන සිටීම වැදගත් නිසා සැකවින් සරලව කියන අපේ කතාව ගැන ඔබේ අවධානය යොමු කරවීමට පමණයි.

දැනීම අතිශය වැදගත්ය. පුංචි පුංචි ගැටළු වලදීත් ලොකු ලොකු ප්‍රශ්න වලදීත් නොසැලී ඉදිරියට යාමට නම් මිනිසා "මිනිසකු" විය යුතුය. ඒ සඳහා දැනීම අත්‍යාවශ්‍යයි. ඒ සියල්ලටමත් වඩා අපි අපේ කතාව දැන සිටිය යුතු වෙමු.

හොඳයි! දැන් ඉතින් යළිත් මාවතට පිවිසෙමු. ගිනිරත් පෘථිවි පෘෂ්ඨය, නොකඩවා ඇද හැලුන වර්ෂාවෙන් සිසිල් ව ගිය කල්හි සොබා දහම විසින් එහි ඉපැද වූ ක්ෂුද්‍ර ජීවියා ද වසර ලක්ෂ ගණනක් තිස්සේ විකාශය වෙමින් ශාක ඇතුලු තවත් ජීවීන් ගණනාවකගේ උපත සිදු කළේය. ජල්ලිමය ජීවීන් වූ මේ සත්ත්ව ප්‍රවාහය පැවැත්ම සඳහා කරන ලද සටනේ දී වෙනස්කම් ගණනාවකට භාජනය වූහ. ජිවය වඩාත් තහවුරු කරනු පිණිස කොටසකගේ සිරුරු ඇට සැකිල්ලක් මගින් ශක්තිමත් කැරිණි. කශේරුකාව සත්තවයාගේ සිරුර තුළට ආවේ එයින් අනතුරුවය. සත්ත්ව පරිණාමයේ මූලික සන්ධිස්ථානයක් වූයේ මේ වෙනසය. අනාගත අවුරුදු ලක්ෂ ගණනක් තුළ වානරයින්, ඉදිබුවන්, උරගයන් සහ පක්ෂීණ් වශයෙන් මිහිතලයට සතුන් උරුම වූයේ පරිණාමගත වූ අර ක්ෂුද්‍ර ජීවියා නිසාය. ඒ ඒක සෛලික ක්ෂුද්‍ර ජීවියා කාලාන්තරයක් තිස්සේ හැඩය, ප්‍රමාණය හා පැවැත්ම ආදි අවස්ථාවන් ගණනක් ඔස්සේ යෙදුණු පරිණාමගත සංචරණයෙහි ඊළඟ විප්ලවීය වෙනසට භාජනය වීමෙන් කශේරුකාව සහිත මාළුවකු බවට පරිවර්තනය විය.

මානව ජීවියාගේ උපත මත්ස්‍යයා ඇසුරින් හට ගැනුන බව විද්‍යාත්මකව ඔප්පු කළේ 19 වැනි සියවසේ චාර්ල්ස් ඩාවින් නැමැති විද්‍යාඥයා විසිනි. මේ දක්වාත් ඒ මතය වෙනස් වී නැත. එහෙත් ඩාවින් උපදින්නට සියවස් ගණනාවකට පෙර උපනිෂද් දාර්ශනිකයෙක් වරාහ පුරාණය නමැති සිය කෘතියෙහි විෂ්ණු ගේ උපත සංකේත කොට ගෙන දශ අවතාරයක් නිර්මාණය කර තිබේ. එම දශ අවතාරයෙහි මුල්ම අවස්ථාව මත්ස්‍ය ජීවියාය. දාර්ශනික මතයක් විද්‍යා මතය සමඟ නිවැරදිව සංකලනය වූ දුර්ලභ අවස්ථාවකි මේ. ඒ දශ අවතාරය අන් කිසිවක් නොව මානව පරිණාමයේ ඒ ඒ අවස්ථාවන් නිරූපනය කරන්නක්. විද්‍යාඥමානව වංශයේ මුල් පුරුක වශයෙන් මත්ස්‍යයා තෝරා ගත්තේ ඔහුට ලැබුණ පොසිලමය සාධක මතය. මත්ස්‍යයාට පෙර ජලයෙහි වූ ක්ෂුද්‍ර ජීවියා මෙන්ම උගේ පරිණාමයන් ද ජලීය සතුන් නිසා උන්ගේ සලකුණක් හෝ ඉතිහාසය විසින් පරිස්සමින් කර නැත. දාර්ශනිකයා මත්ස්‍ය අවතාරය ගැලැපුවේ තර්කානුකූල චින්තනයෙනි.

දස අට පුරාණයෙහි දැක්වෙන විෂ්ණු ආඛ්‍යානයෙහි දශ අවතාරය මානව වංශයේ මූල ඉතිහාසයට කෙසේ යා කළ හැකි ද? ඒ අවතාර දශය මෙසේය. මත්ස්‍ය, කූර්මර්, වාරාහ, නාපසිංහ, වාමන, පරශුරාම, රාම, කෘෂ්ණ. බුද්ධ, කල්කි. සත්ත්ව විකාශයේ ප්‍රධාන සංධිස්ථානය මාළුවාය.


ලේඛක සිරිපාල කඳුමුල්ල මහත්මාගේ අභාවයෙන් පසු උපහාර පිණිස පළ කෙරේ.

**මිනිසා සොබා දහමේ විශිෂ්ට නිර්මාණයකැයි ආදී ග්‍රීක චින්තකයෝ උධෘත කළහ. දේව අනුහසකින මිනිසා පහළ නොවූ බව කී බුද්ධිමතුන් එදා අධර්මාධිකරණය විසින් ඝාතනය කළේය.පරිණාමවාදයට අනුව මිනිසා සකස් වූයේ වානර විශේෂයකින් බව මානව විද්‍යාඥ චාර්ල්ස් ඩාවින් (ක්‍රි.ව.1802-1882) ඔප්පු කළේය.**

කූර්බර් යනු ජලයෙහි ගොඩත් වාසය කළ සත්තව වංශයේ ඊළඟ තත්ත්වයයි. මැඩියා වැනි සතෙකි. මෙම යුගයේ දී ජලයේ වැඩුණු ජීවියා ගොඩබිමට සංක්‍රමණය වූයේය. විද්‍යාත්මකව කිවහොත් ජලජ පරමාණු පෘථිවි පරමාණු සමඟ ගැටී සම්මිශ්‍රණය වීමේ වකවානුවයි. තෙවැනි අවස්ථාව වූ වරාහ යනු ඌරාය. ඌරා දත් ඇති, දිය ගොඩ දෙකම අවශ්‍ය සතෙකි. මේ යුගයේදි වානරයා සහ සිව්පා සතුන් බෙදී යාම ඇරැඹිණි. නරසිංහ අවතාරයෙන් රූපනය වන්නේ නරාහයෙකි. අඩක් වානර අඩක් සිව්පා සතෙකි. වාමන සම්භව වීමේ මුල් අවස්ථාව විය හැකිය. සත්ත්වයා සහ මිනිසා වෙන් කරන මායිම මෙයයි. මෙතැන් සිට මිහිතලය මත කැලෑ මිනිසා දිස්විය. පරශුරාම යනු නොදියුණු ආයුධ භාවිතාවට වනචාරී මානවයා යොමු වූ යුගයයි. මිනිස් වංශයේ දියුණු අවස්ථාවක් විදහා දැක්වෙන්නේ රාම අවතාර යුගයේදීය. බස හුරු වූ ශ්‍රමය කැප කරන, උපකරණ භාවිතයට යොමු වූ මිනිසා මිනිසාගේම පාලකයෙකු ලෙසට ද ක්‍රියා කළේ මේ වකවානුව තුළය. කෘෂ්ණ යුගය එහිම වෘද්ධියයි. මිනිසාගේ චින්තනය සැකැසුණු අවදියකි ඒ. විශේෂයෙන් පරලොව පිළිබඳ සොයා බැලූ විවිධ ඇදහීම් පහළ වූ කාලයයි. බුද්ධ යුගය ගැන අපි දනිමු. ඒ පරිපූර්ණ මිනිසාගේ අවදියයි.

දැන් මානව වංශයේ අවසානයට ළං විය යුතු කාලය එළැඹෙමින් පවතී. තාක්ෂණය කෙළවරටම දියුණු වී මිනිසා නැවත ආපසු ගමන අරඹන යුගය කල්කි වශයෙන් හැඳින්විය හැකිය. අප ඇස් ඉදිරියෙහි ඒ අද්භූත මිනිස් වික්‍රම පෙනෙන්නට ද තිබේ. බුද්ධ යුගයේ පැවැත්ම වසර 5000 කැයි ද කියනු ලැබේ. කල්කි යුගය එළැඹෙන්නේ එයින් පසුවයි.

මෙකී දශ අවතාර රූපකය ස්ථාවර සීමා මායිම් සහිත යුග වශයෙන් සැලැකිය නොහැකිය. මත්ස්‍යයා හටගත් පසුව එමඟින් උරගයන් ද, පක්ෂීන් ද හටගෙන තිබේ. මෙකී විවිධ පරිණාම අවස්ථා සමහර විට එකම වකවානුවක සිදු වන්නට ද ඇත. මෙම විකාශිත සතුන්ගේ වයස දැනට වසර 20 0000000 කැයි කල්පනා කරති. ලොව පළමුවෙන්ම ඇති වූ ස්ථල සත්ත්වයින ක්ෂීරපායි ගණයට අඩංගු ය. උරග පක්ෂී වර්ගයා බිජුලන ගණයට අයත්ය.

මේ හැර ලොව ප්‍රථම ජීවියාට සමාන ක්ෂුද්‍ර ජීවීන් තවමත් ජලාශයන්හි දැකිය හැකිය. ඔවුන් දෙකඩ වීමෙන් හා සිරුර දළු ලෑමෙන්, බෝවන අතර සමාන ක්ෂුද්‍රයන් වශයෙන් දිලීර, පුස්, බිම්මල්, ප්‍රොටසෝවා, ඇමීබා, බැක්ටීරියා හා වයිරස් හැඳින්විය හැකිය. මේවා සත්ත්වයාට යහපතට මෙන්ම අයපහට ද බලපායි. මුල්ම යුගයේ සිටි පෙනහළු මාළුවාට සමාන මත්ස්‍ය විශේෂ ඔස්ට්‍රේලියාව හා ඒ අවට භූදකලා කොදෙව් වලින් සොයාගෙන ඇත. මැඩි බිජුවටින් උපදින කීටයා ටික දිනකින් කුඩා මාළුවෙකු සේ ජලයෙහි සැරි සරයි. තවත් දින ගණනකින් ඌට ගාත්‍රා පිහිටයි. වල්ගය ද වැටී සම්පූර්ණ මැඩියෙකු වෙයි. මේ පරිණාම ධර්මතාවයට වත්මන් නිදසුනකි.

ඉතාම කුඩා මූල ද්‍රව්‍යයේ සිට විශාලතම දේ දක්වා වැලි කැටයේ සිට සූර්යයා දක්වා ප්‍රොටෙස්ථාවාගේ සිට මිනිසා දක්වා මුළු මහත් සොබා දහමම පවතින්නේ අනිත්‍යය තුලයයි බුදුන් වහන්සේට පෙරාතුව සිටි ග්‍රීක දාර්ශනිකයන් පවසා ඇත. ක්‍රි. පූ. 535-475 අතර විසූ හෙරක්ලීටස් අනිත්‍යය පිළිබඳ භෞතික අදහස් කදිමට දක්වා තිබේ. හැමවිටම ගලන්නේ එකම ගංගාවක් නොවේ යයි ක්‍රි. පූ. 7-6 අතර විසූ හෙරඩෝටස් නමැති ග්‍රීක චින්තකයා කියා තිබේ. ඇති වන සියළු දේ නැති වී යාම ස්ථිර යයි ජර්මානු කවියෙකු වූ ග්යෝතේ (1749-1832) තම පොස්ට් නිර්මාණයෙහි (1:3) පවසයි.

**"හෙතු පච්චං සම්භූතං**
**හෙතු භංගා නිරුජ්ජති"**

ගෞතමයන් වහන්සේ හේතුවෙන් උපන් සියල්ල හේතු නිසාම නැතිවෙයි. යනුවෙන් වදාළහ.

ඒ අනුව මුළු මහත් සෞරග්‍රහ මණ්ඩලයම යම් දිනෙක විනාශ වීම ස්වභාවයකි. එය සිදු වන්නේ ඒවායේ සමාරම්භයට බලපෑ හේතු නැවත විනාශ වීමෙනි. කන්දක් නගින මිනිසුන්ට කන්දේ ඉහළ මායිමේදී නැග්මේ අවසානය දැක නැවත ආපසු බසින්නට සිදුවෙයි. එමෙන්ම මිනිසාගේ දියුණුවේ කෙළවර පරිහානියයි. නව තාක්ෂණයේ දියුණුවත් සමඟම ඉතා සූක්ෂම යන්ත්‍ර මිනිසාගේ තැන ගනී. මිනිසා යන්ත්‍ර මට්ටමට වැටෙයි. එවිට මිනිසා සීඝ්‍රයෙන් පරිහානියේ "වෙනසට" භාජනය වෙයි.

වරාහ පුරාණයෙහි විෂ්ණුගේ දශ අවතාරය නිර්මාණය කළ දාර්ශනිකයා මිනිසාගේ අවසාන යුගය කල්කි නමින් අභවර කළේය. අද තත්වයෙන් සිතුවහොත් කල්කි යනු මිනිසා ගත කරන උපරිම තාක්ෂණික ප්‍රවර්ධිත යුගයයි. එය ඇතැම් විට සෞරග්‍රහ මණ්ඩලයේ දී අවසානය විය හැකිය.

මිනිසා ඇතුළු ලොව සියළු දෙය මැවූයේ දෙවියන් විසින් යයි දේවවාදීහු පවසති. ඒ අනුව පෘථිවියේ වයස දෙවියා සිය මැවීමේ කාර්යයෙහි නියුතු වකවානුව හා සම විය යුතුය. එවිට ඒ වකවානුව අවුරුදු හත් අට දහසකට වැඩි නොවේ. දැනට භූ ගර්භයෙන් සොයා ගෙන ඇති මිනිස් ඇට කටු හා එවන් පොසිලයන් සතු කාලය විද්‍යා මිනුම් අනුව වසර ලක්ෂ ගණනකි. මෙයින් පැහැදිලි වන්නේ බුද්ධියේ ජෝතිමත් යුගයකට පසුව නැවත අබුද්ධිමත් වකවානුවක් එළැඹුණු වගයි.

ඈඳහිලි මාධ්‍යයෙන් ජනතාව පාගාගෙන පාලනය කළ යුගයක් තිබුණේය. ලෝකය එහෙම පිටින්ම දේව නිර්මාණයක් බවත් දෙවියන්ගේ මොලොව නියෝජිතයන්ට විනා සාමාන්‍ය කෙනෙකුට ලොව මොනම හිමිකමක් නොමැති බවත් එදා පිළි ගැනීමකි. දෙවියන්ගේ මෙලොව නියෝජිතයන් බවට පත් වූයේ ආගම් ගොඩනැගූ අයයි. ඇතැම් විට ආගම් නිපද වූ ශාස්තෘන්ටත් වඩා ඒවා අනුගමනය කළ ප්‍රචාරය කළ අනුගාමික පූජක පන්ති දේව මහිමය තම වාසියට යොදා ගත්හ. දේව නියමයන්ට එරෙහි මත ඉදිරිපත් කරයි. එදා විද්‍යාත්මක සත්‍යයන් ඉදිරිපත් කළ විද්වතුන් බොහෝ ගණනක් අධර්මාධිකරණය විසින් විනාශ කර දමන ලදි. එහෙත් ජයග්‍රහණය ලැබුණේ විද්වතුන්ටය. දේව මායා කෙමෙන් බුද්ධිමතුන් අතරින් වියැකී යමින් පැවැත්තේය. ක්‍රි.පූ. 95-51 පමණේ දී ග්‍රීසිය විසූ ලුක්‍රෙසියස් 'ආගම මිනිසුන් ගාල්කර තබන වියහකට උපමා කළේය.' මේ මත ඊට සියවස් ගණනක සිටම ග්‍රීසියෙහි භාවිතා වෙමින් තිබුණු ඒවාය. ඇනෙක්සි මැන්ඩර්(ක්‍රි.පූ. 6 වැනි සියවස) ඇනෙක්සි ගෝරස්(ක්‍රි. පූ. 500-428) එම්පෙඩොක්ලස්(ක්‍රි.පූ. 485-425) සොක්‍රටීස් (ක්‍රි. පූ. 469-399) ඇරිස්ටෝටල්(ක්‍රි.පූ,384-322) හිපොක්‍රාටි (ක්‍රි.පූ.460-377) වැනි දාර්ශනිකයෝ ලෝකයත් මිනිසාත් සෑදුණේ කාගේවත් මෙහෙය වීමකින් නොව, ස්වභාව ධර්මයේ ප්‍රපංචයක් ලෙසිනැයි කියා සිටියේය.

වර්තමාන විද්‍යා දියුණුවත් සමඟ ලෝකය කාගේවත් මැවීමක් නොවන බව තවදුරටත් පැහැදිලි කර ඇත. පරිණාම මාවතෙහි බොහෝ දුර අෑතකදී සකස් වූ මානවයා වර්තමානයෙහි හිතන්නටත් බැරි ගමනකට අවතීර්ණව සිටිති. අනාගතයේදී මිනිසා, බුද්ධියෙන් දේවත්වයට පත් වන බවට පෙරනිමිති පහළ වී තිබේ එහෙත් එයම ඒ ඔරොත්තු නොදෙන දියුණුවම මානව වංශයේ අවසානය ද සනිටුහන් කරන බව නො අනුමානය.

සිරිපාල කඳුමුල්ල

# මාර සංග්‍රාමයෙන් ජය ගත් බුදු සමිඳුණෝ...

**නික්ලේශී අප තථාගත බුදුරජාණන් වහන්සේගේ බුද්ධ චරිතය පිළිබඳ හැදෑරීමේ දී එහි ඇති සුවිශේෂී ස්ථානයන් පිළිබඳව අවධානය යොමු කළ යුතුව ඇත. මෙවර උදාවෙන පින්බර වෙසක් දිනය නිමිති කරගෙන අපට බුද්ධ චරිතය සිහි ගැන්වීමට පුළුවන. උන්වහන්සේගේ ඉපදීම, බුදුවීම හා පිරිනිවීම යන තෙමඟුල මුල් කොට ගෙන වෙසක් දිනය තුන් ලෝක වාසී බෞද්ධ බැතිමතුන් දාන, ශීල, භාවනා යන ත්‍රිපුණ්‍යක් ක්‍රියා හා ආගමික චාරිත්‍ර වාරිත්‍ර සිදු කරති. ඇත්තෙන්ම බෞද්ධයින්ට පමණක් නොව අබෞද්ධයින්ට පවා ශ්‍රද්ධා ලම්භන ප්‍රීතියක් ගෙන දෙන දිනයක් හැටියට වෙසක් දිනය හැඳින්වීමට පුළුවන.**

උන්වහන්සේ ගිහි කාලයේදී සියලු සැප සම්පත් වලින් අනූනව කල් ගෙවූහ. රම්‍ය, සුරම්‍ය, සුභ වැනි මාළිගා අතර හිඳ සියලුම කම් සැප විඳිමින් සිටි උන්වහන්සේ සතර පෙර නිමිති දැකීමත් සමඟ ගිහි ජීවිතය අතහැර පැවදි ජීවිතයට පත්වීමට සිතූහ. එසේ සිතා සියල්ල අතහැර අභිනිෂ්ක්‍රමණය සිදු වන දිනේ දීම තව දින 7 කින් සක්විති රාජ සම්පත්තිය ලැබෙන බවත් ඒ සඳහා වැඩ ඉන්නා ලෙසත් ආරාධනාවක් ලැබිණ. එය කෙළ පිඩක් සේ එළිපිටට විසි කර ප්‍රතික්ෂේප කොට, සිදුහත් බෝසතාණෝ එම ගමනට පිටත් විය. බුදු බව පතා යාමට ආරම්භයේදී ම එය වැළැක්වීමට බාධක ආවද එය පසෙක ලා සිදුහත් බෝසතාණෝ ඉදිරියට ඇදුනාහ.

එසේ අභිනිෂ්ක්‍රමණය කොට දුෂ්කර ක්‍රියා කරන බෝසතාණන් වහන්සේ වෙත දිනක් මාරයා පෙනී සිට ඔබ දැන් ඉතා කෙට්ටුයි, අවලස්සන යි, මරණය ඔබ ළඟම යි, ජීවත් වීමට බලන්න. ජීවත් වුනොත් පිංකර ගත හැකියි මෙබඳු දුෂ් "කර ක්‍රියා කිරීමෙන් පලක් තිබේද?"ආදී වශයෙන් බෝසතාණන් වහන්සේගේ උත්සහය නැවැත්වීමට පෙළඹ වීමක් කළේය. එවිට බෝසතාණන් වහන්සේ පව්කාර මාරය, මම නුඹව හඳුනමි. නුඹ මෙහි ආවේ කුමකට දැයි මම දනිමි. නුඹ ඔය කියන පිංවලින් මට පලක් නැත. නුඹේ මාර සේනාවන් මම හඳුනමි. බියගුල්ලෙකුට නම් ඔබේ මාර සේනාව පැරදවිය නොහැකිය. නොපසුබස්නා සූර පුරුෂයෙකුට පැරදවිය හැකිය. ජීවිතය කෙරෙහි මගේ ආශාවක් නැත. පැරදීලා ජීවත් වනවාට වඩා සටන් බිමෙහි මරණය මට උතුම් යයි " සිදුහත් බොසතාණෝ පැවසීය. එවිට මාරයා නොපෙනී ගියේය.

මේ ආදී වශයෙන් අභිනිෂ්ක්‍රමණයේ සිට බුදු බව ලබාගන්නා අතර කාලය තුළ උන්වහන්සේට මාරයා හා මාර සේනාවන්ට නොයෙක් වර මුහුණ දෙන්නට සිදු විය. ඔවුන් සිදුහත් මහ බෝසතාණන්ගේ බුදු වීම වැළැක්වීමට නොයෙක් උපක්‍රම සිදු කළහ.

පස්වන සතියේ දීම බුදුරජාණන් වහන්සේගේ සිත සසල කිරීමට සිතූ මාරයා වරෙක මහා ඇතෙකු ලෙස ද, තවත් අවස්ථාවක අවතාර සේ වූ ස්වරූපය මවා ගෙන ද පැමිණ ඇත. එහෙත් ඒ මාරයා යයි බුදුරජාණන් වහන්සේ විසින් හඳුනා ගනු ලැබූ විට ඔහු දොම්නසට පත් විය.

අනතුරුව තණ්හා, රතී, රඟා යන මාර දූවරු තිදෙනා උන්වහන්සේ රාගයෙන් පොළඹවා ගැනීමට පැමිණ රැඟුම් දැක්වූහ. ඔවුන්ගේ රූප විලාසය දකින පුහුදුන් පුද්ගලයෝ උන්මාදයට පත්වෙති. මිහිරි වූ බොළඳ රසමුසු වදන් තෙපලමින් රඟන්නට වුවද බුදුරජාණන් වහන්සේ ඔවුන්ගේ ලීලා විලාසය ජරාපත් වැඳිරියන්ගේ රැඟුමන් සේ සිතා සමාධි ගත සිතින් වැඩහුන් සේක. මාර දූවරු පැරද පළා ගියහ.

මේ ආකාරයෙන් බුද්ධ චරිතය දෙස විමසිලිමත්ව බැලීමෙන් පැහැදිලි වන්නේ දුෂ්කර ක්‍රියාවේ පටන් බුදු බව දක්වාත් ඊට අනතුරුවත් මාර සේනාවන්ගේ බාධක අභියෝග හා වැළැක්වීම් වලට ලක් වන්නට සිදු වුවද බුදුරජාණන් වහන්සේගේ චරිතය තුළ කිසිදු තැනක මාරයාට හෝ මාර සේනාවට යටත් වීමක් හෝ ඔවුන්ට බියේ යන ගමන නැවැත්වීමක් සිදු කර නැත. තවත් තැනක දස මාර සේනාවක් ගැනද සඳහන් වේ. එනම්,

1. කාමය
2. අරතිය
3. සාපිපාසාව
4. තෘෂ්ණාව
5. ථීන මිද්ධය
6. භය
7. විචිකිච්ඡාව (සැකය)
8. ගුණමකු බව හා දැඩි බව (මක්ඛි / පලාසී)
9. ලාභ, සත්කාර හා වැරදි මඟින් ලබන යසස (ලාභෙන ලාභං නිජිගිංසනතා)
10. තමන් උසස් කොට, අනුන් පහත් කොට තැකිම

මේ සියලුම මාර සේනාවෙන් ජය ගැනීමට අප තථාගත බුදුරජාණන් වහන්සේට ශක්තිය ලැබීම ගැන අනුගාමිකයන් වශයෙන් අප කවුරුත් සතුටු විය යුතුය. එය සාමාන්‍ය කෙනෙකුගේ ජීවිතයටද සම්බන්ධ කර ගැනීමෙන් අභියෝග ජය ගැනීමට පුළුවන්කමක් ඇත. ඒ ගැන කිසිඳු සැකයක් නැත. බුදුරජාණන් වහන්සේට මුහුණ දිමට සිදුවූ අභියෝග වලින් සියයට එකක්වත් සමහරවිට අපට මුහුණ දීමට නොහැකි වන්නට පුළුවන. එයට හේතුව උන්වහන්සේ ඒ ගමන ගියේ මුළු මහත් සත්වයා වෙනුවෙන් වීමය. උන්වහන්සේ මුළු මහත් සත්වයා වෙනුවෙන්ම අපමණ දුක් විඳිමින් බුද්ධත්වය ලබා ගැනීම සිදුකළ ද එය මාර සේනාවගේ දහසක් අභියෝග මතින් කළ වීයඃ ක්‍රියාවකි. එය හොඳින්ම පැහැදිළි වන තැනක් ලෙස බුද්ධත්වය ලබාගෙන එය සාමාන්‍ය ජනතාවට දේශනා කිරීමට යෑමේදී බුදුරජාණන් වහන්සේ තුළ ඇති වූ සිතුවිල්ල දැක සහම්පති බ්‍රහ්ම තෙමේ කළ ප්‍රකාශයෙන් වඩාත් පැහැදිළි වනු ඇත. එනම්,

මාර සංග්‍රාමයෙන් ජයගත් මහෝත්තමයන් වහන්ස, ලෝසතුන් කෙරෙහි අනුකම්පාවෙන් අමා දහම දේශනා කරන සේක්වා. නැගී සිටිනු මැනවි. ධර්මය දැන ගන්නෝ බොහෝ වෙති." ආදී වශයෙනි.

එම සහම්පති බ්‍රහ්මයාගේ ප්‍රකාශය තුළින් ම බුදුරජාණන් වහන්සේ මාර සංග්‍රාමයෙන් ජය ගත් බව පැහැදිළි වේ. මාර යුද්ධයක් ජය ගැනිම බුදුරජාණන් වහන්සේ සිදු කළ ආකාරය විශ්ම ජනකය. එසෙම නම් උදා වෙන වෙසක් පුන් පොහෝ දිනය අප බුදුරජාණන් වහන්සේගේ තෙමඟුල සිහි කරමින් ත්‍රිපුණ්‍යක්‍රියා හා ආගමික චාරිත්‍ර සිදු කරන අතරම ජිවිතයට එන ඕනෑම අභියෝගයක් ජය ගෙන තම ඉලක්කය කරා යෑමට බුද්ධ චරිතය තුළ ඇති මාර සංග්‍රාමයෙන් ජය ගැනීමේ " උතුම් පණිවිඩය ආදර්ශයට ගැනිමට සිතට ගත යුතුය. ඒ තුළින් මෙලොව ජය ගැනිම, පරලොව ජය ගැනීම හා නිවන් ක්ෂාත් ක්ෂෘත් කරගැනිමට ද අධිෂ්ඨාන කර ගත යුතුය.

> *"බුදුරජාණන් වහන්සේට මුහුණ දිමට සිදුවූ අභියෝග වලින් සියයට එකක්වත් සමහරවිට අපට මුහුණ දීමට නොහැකි වන්නට පුළුවන. එයට හේතුව උන්වහන්සේ ඒ ගමන ගියේ මුළු මහත් සත්වයා වෙනුවෙන් ම විමය.*

කුලියාපිටිය වලකුඹුරුමුල්ල ශ්‍රී නන්දනාරාමාධිකාරී
ගලගෙදර රතනවංශ හිමි.

# හිත මිතුරු අමර නිවන

**අරහත් ඵලය ආදීකොට ඇති ලෝකෝත්තර ආර්යය ඵල හි ලෞකික පංච අභිඥාඅෂ්ඨ සමාපත්ති චිත්ත දියුණුවෙන් මනුෂ්‍ය චිත්ත සන්තානය හි පහළ වන්නාවූ අතිශයින්ම නිරාමිෂ ආශ්වාද ජනක අත්භූත ජනක ශ්‍රේෂ්ඨ සිතුවිලි සමුදයක අග්‍රගණ්‍ය ඵල වේ. මන පූර්වාංගම කරගෙන මන ශ්‍රේෂ්ඨ කරගෙන මනෝම උපදින සිත විඤ්ඤාණ ශක්තියේ ක්‍රියාකාරීත්වයයි.**

මේ මිහිපිට උසස් මානසිකත්වයක් ඇතිව මනුෂ්‍යයා පහළ වකවානුවේ සිට ඔහු විසින්ම මානසික ඒකාග්‍රතාවයෙන් සිත දියුණු කිරීමෙන් ඇතිකරගත් ඉහත ආධ්‍යාත්මික දියුණුව මෙතෙක් ලෝකයේ පහළ වූ පහළ වන්නාවූද නවීන විද්‍යාව හමුවේ අනාථ වී නැති පරම උත්කෘෂ්ඨ ශක්ති සමුදායකි. මේ චිත්ත ශක්තියට අභියෝගයක් නැත. අතීතයේ වූයේද නැත. අනාගතයේද මේ අධ්‍යාත්මික දියුණුවට අභියෝගයක් නැත්තේමය. චිත්ත ශක්තිය වර්ධනය හමුවේ නවීන විද්‍යාව අසරණය. භෞතික දියුණුව අධ්‍යාත්මික දියුණුව හමුවේ පරාජිතය.

සත්‍ය අවබෝධ කල උත්තමයාට සුඛිත මුදිත සැසසුන පුද්ගලයෙක් මේ ලෝකයේ කොහෙවත් නැත. බෞද්ධ දර්ශනය හැර ලොව පහළ වූ සියළුම ආගම් දර්ශන වලින් මිනිසාගේ සදාකාලික විමුක්තිය ලංකර ගත හැක්කේ මරණින් පසුවය. එහෙත් නව ලෝකෝත්තර ධර්මය හෙවත් අරි අටඟි ඵල හා නිර්වාණය මේ ජීවිතයේදීම ලබා ගත හැක. චෛතසික දියුණුවේ ශ්‍රේෂ්ඨතම අවස්ථාව අරහත් ඵලයයි. අවම ඵලය සෝවාන් ඵලයයි. ඒ ආර්යය උත්තමයෝ චෛතසික උපද්‍රව වලින් නිදහස් වූහ. මානසික ගැටළු වලින් මිඳුනෝ වෙති. පරිපූර්ණ මානසික, චෛතසික සෞඛ්‍යයෙන් යුක්ත වූවෝ වෙති. ඒ ආධ්‍යාත්මික දියුණුවේ උපරිම ඵලය සම්මාසම්බුද්ධත්ව සර්වඥතා ඥානයයි.

ඔබත් මේ නිවීම සැනසීම මේ භවයේදීම ඇතිකර ගැනීමට චිත්ත ධෛර්යය ඇති කර ගන්න. බුද්ධ ධර්මය යනු (බුද්ධ = අවබෝධය, ධර්මය = සත්‍යයයි.) මිනිසා සතු මානසික ශක්තිය අසීමිත මිනිස් හැකියාවන් පුබුදුවා සදාකාලික විමුක්තිය ළඟාකර දෙන ක්‍රමය හා විධිය උගන්වන ස්භාව ධර්මයකි.

මානව හිතවාදී සර්වඥයින් වහන්සේ බාහිර ලෝකයේ නොපෙනෙන ගුප්ත බලවේග ඇසට නොපෙනෙන සර්වබලධාරී ඊශ්වරයෙකු හෝ දෙවියෙකු කෙරෙහි තබන විශ්වාසයට වඩා ස්වශක්තිය, මිනිස් හැකියාව මතින් සමෘද්ධිය ළඟා කර ගන්නා හැටි පෙන්වා දුන්හ. මේ මිනිසාගේ මානසික ශක්තිය, අගය, මහිමය පෙන්වා දෙන බුදු සමය මෙතෙක් ලොව පහළ වූ ආගම් දර්ශන හා අනාගතයේ යම් තාක් පහළ වන්නා වූ ආගම් අතර පළමු ස්ථානයේ වැජඹෙන බව බුද්ධිමත් මිනිසා විසින්ම තීරණය කරනු ඇත.

දීඝ නිකායේ බ්‍රහ්මජාල සූත්‍රයේ බුද්ධකාලීන භාරතය අෂ්ටි කෞතුකාගාරයක්ව පැවති බව පැහැදිළි කරයි. එදා මෙදා තුර ලොව පහළ වූ ආගම් දර්ශන අතර බුදු දහම ස්වාධීන අන්‍යතාවයක් ඇති එකම දර්ශනයකි. අන්‍ය ආගමික නායකයන් සත්වයා ඇතුළු ලෝක ධාතුවම සර්වබලධාරී ඊශවරයෙකු දෙවියෙකු මැවුම් කරුවෙකු නොපෙනෙන බලවේගයක ඵලයක් යැයි පවසා ඇඟ බේරාගෙන ඇත. ඓතිහාසික හා ජීවවිද්‍යාත්මක කරුණු පදනම් කරගෙන මේ බව සොයා බැලීමේදී මැවුම්කාර දේහ නිර්මාණ හිස් ප්‍රලාපයක් පමණි. ශාන්ති නායකයාණන් වහන්සේ මෙලොව හේතුවක් නිසා හටගත් බවත් ඒ හේතුව නැති කිරීමෙන් ලෝකය (දුක) නැති කළ හැකි බවත් පැහැදිළිවකරුණු සහිතව සනාථ කර ඇත්තාහ.

**"යේ ධම්මා හේතුප්පභවා තේසං හේතුං - තථාගතෙ ආහ**
**තේසං ච යො නිරොධො එවංවාදී - මහා සමණො "**

මුළු ලෝකයටම (රූප, වේදනා, සංඥා, සංකාර, විඤ්ඤාණ) හේතුවක් (අනිත්‍ය තාවය හෙවත් වේගය) නිසා හට ගත්හ. සංඛ සංඛාර අනිච්චාති " හටගත් සියල්ල (ලෝකයම) අනිත්‍ය තාවය පදනම් කරගෙන හටගෙන ඇත. මෙය ප්‍රඥාවෙන් දැකීම තුළින්ම ලෝකය (හිත) හට ගැනීම නැති කළ හූත මේ ලෝකය හෙවත් දුක හෙවත් සිත නිරුද්ධ කරන හැටි තථාගතයාණන් වහන්සේ පෙන්වා දෙති. ඒ මඟ ගමන් කළහොත් ලෝකයෙන් එතෙර වීමට පුළුවන. තුමෙහති කිච්චං ආතසං අකඛාතාරෝ තථාගතා " තථාගතයන් වහන්සේ මඟ කියති. අපි වඩමු. ප්‍රතිපත්තීන් ක්‍රියා දාමයත් තුළින්මයි විමුක්තියත් ලබාගත හැක්කේ . ප්‍රාර්ථනා කිරීමෙන් යාඥාකිරීමෙන් වැඳවැටීමෙන් කවදාවත් විමුක්තියත් සැපතත් බලාපොරොත්තු වීම සිහිනයක් පමණි. යථාර්තය එය නොවේ. මේ විමුක්ති මාර්ගය ලොව පහල වූ (බුදු දහම හැර) කිසිම ආගමක නැත. ඒකායන නිවන් මාර්ගයේ මේ සම්බුද්ධ ශාසනයේ පළමු ශාවකයාත් , දෙවන ශ්‍රාවකයාත්, තෙවන ශ්‍රාවකයාත් සිව්වන ශ්‍රාවකයාත් දැකිය හැකි බව තථාගතයන් වහන්සේ විසින් දෙසූ සේක. කිසිම ශාසනික ශ්‍රාවක භාවයක් නැත.

ගම්පහ සිරි සීවලී හිමි .


...ඇසුරෙන්... ශේක්ස්පියර් ...නාටකය...
5
ප්‍රේම වෛරය
සැකසුම, චිත්‍ර
ඕ.. මාමේ.. මාමේ. මෙහාට එන්න..
මටත්.. වළලු ගන්න ඕනි..
ආ ගන්න.. ගන්න ලාබෙට දෙන වළලු
මට කතා කළාද?
ඕ.. ඔච්චි මාමෙ මටත්.. ඔය... ලස්සන වළලු ටිකක් දීල ..යන්න....
ඕ.. තෝරගන්ඩ.. තෝරගන්ඩ... මේව වටිනා වළලු..
ඔන්න මං..
වළලු ඉල්ලල
අනේ... හරි ලස්සන.. වළලු.. දිලිසෙනවා... මෙච්චර.. ලස්සන.. අනේ මේ ලස්සන වළලු ටිකක් මටත් දෙන්න ..මාමෙ...
ඕ.. අනේ මෝ.... වෙළෙන්ද..ශොනවා.. කියයිද මංද.. මෝ- කෙලිගෙං මට හරි කරදරේ ඔය වළලු අරං දෙන්ට කියලා..
ඕ.. හොඳ.. හොඳ.. තෝර ගනිමුකෝ... එහෙනං වළලු.. ..කාසි පණම් දීල හිටිමුකෝ.. ..වළලු දෙන්ට....
අනේ දරුවෝ.. අපි හැමෝම. දුප්පත් උදවිය.. අපිට.. ..වළලු ගන්ට කාසි පණම් ..නැහැ දරුවෝ....
..මොකක්..
ඕ.. එහෙනං මොන.. ඉල්ලුවකටද මට කතා කළේ.. කාසි පණම් නැතුව මං කාටවත් නොව දෙන්නෙ නෑ.. ..මං.. යනව යන්ඩ....

## 06 පිටුවෙන්

පෙළඹවීම, පරිත්‍යාගය, ශ්‍රේෂ්ඨ ගුණයේ පිහිටීම, මරණය පිළිබඳව සිහිකිරීමෙන් පව් නොකර සිටීම, පංචස්කන්ධයේ යථා ස්භාවය යම් පමණකින් තේරුම් ගැනීම වගේම මේ භාවනා කර්මස්ථාන තිහම තුළින් ධ්‍යානඵල සම්පත්තීන් කරා සිතේ සමාධිය දියුණු කළ හැකියි.

ඊළඟට සතර බ්‍රහ්ම විහරණ, සතර පංචස්කන්ධයේ යථා ස්භාවය යම් පමණකින් තේරුම් ගැනීම වගේම මේ භාවනා කර්මස්ථාන තිහම තුළින් ධ්‍යානඵල සම්ප්තීන් කරා සිතේ සමාධිය දියුණු කළ හැකියි.

ඊළඟට සතර බ්‍රහ්ම විහරණ, සතර බ්‍රහ්ම විහරණ කියන්නේ මෙත්තා, කරුණා, මුදිතා, උපේක්‍ෂා වලට මේ හතරෙන් පළමු එක මෛත්‍රියනෙ. මෛත්‍රී භාවනාවෙන් මෙලොව ආනිසංස 11 ක් ලැබෙන බව මෙත්තානිසංස" සූත්‍රයේ සඳහන් වෙලා තියෙනවා. මේ භාවනා හතරේ උපරිම ලෞකික ඵලය තමයි බ්‍රහ්මලෝක උප්පත්තිය තෘතීය ධ්‍යානය දක්වාත් සිත දියුණු කළ හැකියි.

ඊළඟට ආරුප්ප හතර, ඒ තමයි ආකාසානඤ්චායතනය. විඤ්ඤදයතනය. ආකිඤ්චඤ්ඤදයතනය, නෙවසඤ්ඤ නසඤ්ඤදයතනය. මේ හතර වැඩීමෙන් චතුර්ධ්‍යානය දක්වාම සිත දියුණු කළ හැකිය.

ඊළඟට ආහාරේ පටික්කූල සංඥාව. අපි මුඛයෙන් ඇතුලට ගත්තාවූ ආහරයේ පිළිකුල් බව යථා ස්භාවය මෙනෙහි කිරීම, අවසාන සමථ කර්මස්ථානය චතු ධාතු වවත්ථානය, චතුධාතු වවත්ථානය කියල කියන්නේ මේ ශරීරය පඨවි, ආපෝ, තේජෝ, වායෝ, වශයෙන් ධාතු වශයෙන් ගෙන මෙනෙහි කිරීම.

පිංවත, මේ භාවනා තුළින් ලැබෙන උපරිම ඵලය චතුර්ථ ධ්‍යානයනෙ. මේ ධ්‍යාන භාවනාව ලිහිල් කිරීමෙන්, අතහැරීමෙන්, සම්පූර්ණයෙන්ම නැතිවෙලා යන නිසා මේවා නිවනට හේතු කාරක වෙන්නේ නෑ. ඒ ලබන භාවනා ප්‍රතිඵල වලින්, ලබන ලෞකික ඥානයන්ගෙන් මෙලොව පරලොව සැප, සැනසීම, ශාන්තිය, ලබා ගන්න පුළුවන් වෙනවා.

දස පුණ්‍යක්‍රියාවල 4,5 පුණ්‍ය ක්‍රියාවන් වෙන්නේ පිංදීම සහ පිං අනුමෝදන්වීම.

ඊළඟට වෙය්‍යා වච්ඡ" වෙය්‍යා වච්ඡ කියන්නේ වත්පිළිවෙත් කිරීම, මොනවද වත්පිළිවෙත් කියන්නේ. තමන්ගේ නිවසට මහා සංඝරත්නය වඩිනවිට දෙපා දෙවීම, අසුන් පැනවීම, පවන් සැලීම, පෙරගමන් පසු ගමන් කිරීම, විහාරස්ථානයට ගිය විට මළුපෙත්මං ඇමදීම, වෙහෙර විහාර පිරිසිදු කිරීම, කුණු රොඩු ඉවත් කිරීම, ගිලං භික්‍ෂූන් වහනසේලාට වයෝවෘද්ධ භික්‍ෂූන් වහන්සේලා නෑවීම, සිව්රු සේදිම, ආදි කටයුතු වත්පිළිවෙත් කියන්නේ.

මේ තුළින් ලැබෙන පිං මහිමයෙන් නිදුක් නීරෝගී බව, සිතේ තැන්පත් බව, කෙළෙස් තුනී වීම, මානය අඩුවීම, මෘදුමොලොක් සිරුරක් ලැබීම. කීර්තිය, තේජස, ලෞකික ප්‍රඥාව ලබාගන්න පුළුවන් වෙනවා.

මීළඟ පුණ්‍ය කර්මය වන අපචායනය නැත්නම් වැඩිහිටියන්ට ගෞරව කිරීම, වැඳීම, පිදීම තුළිනුත් ඉහත ආනිසංසයෝ ලැබිය හැකි වෙනවා.

ධර්ම දේශනයත් ධර්ම ශ්‍රවනයත් දස පුණ්‍යක්‍රියාවට අයිති පිංකම් දෙකක්. අවසාන පුණ්‍ය ක්‍රියාව දිටඨිජු කර්ම" දිටඨිජු කර්ම කියල කියන්නේ තමා තුළ පවතින දාන, ශීල, භාවනා දී පුණ්‍ය ක්‍රියා පිළිබඳව පැහැදීම, ප්‍රසාදය, නිවැරදි බව දැකීම, තමන් කරන යම් පුණ්‍ය කර්මයක් තියනවා නම් ඒ පිළිබඳව නිවැරදි අවබෝධයකින් කර්මය කර්ම ඵලය අදහාගෙනම කරන්න ඕන. ලාභ, ලෝභ, කීර්ති, ප්‍රසංසා ලැබීම සඳහා පිං නොකිරීමයි දිට්ඨිජු කර්ම" කියල කියන්නේ.

ඉහත සඳහන් ආකාරයේ පුණ්‍ය කර්ම සිදුකොට පිංවත ඔබගේ මෙලොව පරලොව දෙලොව සැනසීම ලබත්වා.

## 04 පිටුවෙන්

# නිවන් මගට පාර කියන නිදහස් ජීවිතය

මෙලෙස තමුන් වහල්කම්, අකුසලකම් කරමින් රැස්කරගත් දේ මහා වටිනා දෙයක්ද? එය විනාශවන දෙයක් නොවේද? කියා සිතිය යුතුය. ඒ නිසා ඇතිවුන අකුසලයන්ට වන විපාක වශයෙන් ආත්ම ලක්‍ෂ කෝටි ගණන් නිරය, ප්‍රේත, තිරිසන්, අසුර යන සතර අපායන්හි දුක් විදීමට සිදුවේ. ධාතු හතරකින් සෑදුන වෙනස් වන, විනාශවන රූපයන් නිසා, තමන් තමන්ට කරගෙන ඇති හානිය කොතරම්ද? යන්න සිතිය යුතුය. අනිත් අය තමන්ට කරන හානියෙන් සිදුවන්නේ කුඩා හානියකි. නමුත් තමන් තමන්ට කරගන්නා හානිය අතිමහත්‍ය.

භාග්‍යවතුන් වහන්සේ තමන්ට අයිති නැති, තමන්ගේ වසඟයේ පවත්වා ගෙන යා නොහැකි දේ අතහරින ලෙස දේශනා කර ඇත්තේ මෙම වහල් භාවයෙන් මිදීම සඳහාය. පහසුවෙන් පෝෂණය කළ හැකි සැහැල්ලු සරල ජීවිතයක් ගතකරමින් තමන්ගේ අවශ්‍යතාවය මත පමණක් නතරවන ලෙස උන්වහන්සේ දේශනා කර ඇත.

ලෝකයේ සම්පත් සොයන ජීවිතයකට සැමදා අත්වන්නේ දුකමයි. ලෝකය අතහැර දමන ජීවිතයක ඇත්තේ සැපයකි. භික්‍ෂු ජීවිතයක් යනු ලෝකය අතහරිමින් නිවීම සොයන ජීවිතයකි.

භික්‍ෂුව, ලෝකයේ ඇති සම්පත්වල නොඇලී, ඒවා අල්ප වශයෙන් පරිහරණය කරමින් ලෝකයෙන් එතෙරට ගමන් කරයි. එය සරල සැහැල්ලු ජීවිතයකි. චීවර, පිණ්ඩපාත, සේනාසන යනාදි පැවැත්මට අත්‍යාවශ්‍ය දේ පමණක් භාවිතා කරමින් නිදහස් නිවහල් ජීවිතයක් ගත කරයි.

සාමාන්‍ය ගිහි ජනතාවත් අවශ්‍යතාවය මත පමණක් රැඳෙමින් කටයුතු කරනවා නම්, සම්පූර්ණ නිවහල් ජීවිතයක් නොලැබුනත් යම්තාක් දුරට නිදහස් නිවහල් ජීවිතයක් ගත කළ හැකිය.

ඉතා කලාතුරකින් ලැබෙන මනුෂ්‍ය ජීවිතය රෙදි කෑලි, ලී කෑලි, ප්ලාස්ටික් කෑලි, ලෝහ කෑලිවල වහලෙක් නොකර, බුද්ධ සාසනය පවතින කාලයේ ප්‍රයෝජනයක් ගත යුතුය. නැවත මෙවැනි අවස්ථාවක් ආත්ම කෝටි ගණනකටවත් ලැබේ දැයි සැක සහිතය.

බුදුපියාණන් වහන්සේ මනුෂ්‍ය ජීවිතයක් ලැබීමේ දුර්ලභ බව අවුරුදු සියයකට වරක් පමණක් මුහුද මතුපිටට එන, ඇසක් අන්ධ කැස්බෑවෙක්, විය සිදුරකින් පසලොස්වක සඳ දකිනවා වගෙයි ලෙස උපමාවකින් දේශනා කර ඇත. එබැවින් පංචකාමයන්ගේ සහ අන්‍යයන්ගේ වහලුන් නොවී බුදුපියාණන් වහන්සේ දේශනා කළ මාර්ගයේ ගමන්කොට නිවහල් ජීවිතයක් තුළින් සදහටම නිවී යාමට අධිෂ්ඨාන කර ගනිමු.

## රංගිරි ශ්‍රී ලංකා බොදු පැන විසඳුම් - (අන්තර්ජාල කලාපය ප්‍රශ්න අංක 05)

බොදු පැනයට පිළිතුරු එවා වටිනා දහම් පොත් පාර්සලයක් දිනාගන්න.

### මාර්තු - මැදින් මස පොහොය ප්‍රශ්නයඃ-

**05). බුදුරජාණන් වහන්සේ වැඩිවාර ගණනක් වස්විසුවේ කවර ස්ථානයකදීද?**

**කූපනය**

නම : ..................................................

ලිපිනය : ..................................................

පිළිතුර : ..................................................

දුරකථන අංකය : ..................................................

දිනය : ..................................................

අත්සන : ..................................................

ඔබේ විසඳුම් තැපැල්පත්වල පමණක් ලියා **'රංගිරි ශ්‍රී ලංකා බොදු පැන විසඳුම්', රංගිරි ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය, අංක 130, නුවරපාර, දඹුල්ල.** යන ලිපිනයට **2020-03- 20 දිනට පෙර** එවිය යුතුය.



**ජයග්‍රාහිකයින් තෝරා ගැනීම කුසපත් ඇදීමෙන් තෝරා ගැනේ.**

සාහිත්‍ය

# සුරස අතිරේකය




ගලන්න ගලන්න ගලන්න
ගංගාවක් වී ගලන්න
උල්පත පසු කර
නැවක් වෙලා නතර වෙන්න
නෙළුම් මලක් යට

නිල් දිය මත ගල් කැටයක්
වැටුණු වෙලාවට
රැල් සිය දහසක් නැගේවි
රිදිලා හදවත

දුවිල්ලෙන් වැහුණු දාට
මුළු මිටියාවත
සිහි කරන්න කඳු පාමුල
මව් කිරි උල්පත

බිම් මල් යට පිපුණු පැතුම්
පෑගී යන විට
කඳු මුදුණට නැග බලන්න
ජීවිතයේ උස

ගේය පද - රත්න ශ්‍රී විජේසිංහ
තනුව හා සංගීතය - ආචාර්ය
ප්‍රේමසිරි කේමදාස
ගායනය - ඉන්දිකා සමරසේකර

# කඳු මුදුනට නැග බලන්න ජීවිතයක උස


රත්න ශ්‍රී විජේසිංහ මහතා


ආචාර්ය ප්‍රේමසිරි කේමදාස මහතා

උල්පතකින් මතු වන කුඩා දිය දහර එක තැනක නතර නොවේ. එය ගඟක් වී ගල් පර වල වැදෙමින් , විටෙක කඳු මුදුන් වලින් ඇල්ලක් සේ කඩා වැටෙමින් ඉදිරියට ගලා යයි. එක් උල්පතකින් උපදින ගංගාවට අතරමැද දී තවත් එවැනිම අතු ගංගාවන් එක් වී නිම්න තැනිතලා පසුකොට අවසන මහ මුහුදට ගලා යයි.

ගංගාවේ හැසිරීම අපගේ ජීවිතයට උපමා කළ හැකිය. ඉතා කුඩා උල්පතකින් මතුවන ජීවිතය සෙමෙන් සෙමෙන් ඉදිරියට ඇදෙයි. ගල් පර නැමැති අසීමිත බාධක හමුවේ ද නොනැවතී ජීවිතය ගලයි. වියළි කාලයේ කෘෂව යන දියදහර දුක් කම්කටොළු වලට මුහුණ දෙන මිනිසෙකු වැන්න. වස්සානයේ දී යළිත් ගං දිය මල්වර වෙයි, කෙළිලොල්ව කිරි සිනා නංවමින් ගලා යයි. අතර මැද මුණගැහෙන අතු ගංගා යනු ජීවිතයට එක් කර ගන්නා ජීවිත පරිඥානය මෙන්ම ධනය හා බලය ද විය හැකියි. ජීවිත පරිඥානය තුළින් තමන් වටා වූ නිම්න භූමිය ද සරුසාර කරයි. අවසානයේ අවසානයේ මුහුද නැමැති මරණය වෙත ළගා වෙයි. ගඟක උරුමය නීරස කරදියට මුසුවීමය. මිනිස් දිවියක උරුමය මරණය කරා ගමන් කිරීම ය.

ගඟක උරුමය නීරස කරදියට මුසුවීම වුව එම නීරස අවසානය ගැන ළතවෙමින් ගඟ සිය කාර්යන් අමතක නොකරයි. සියලුම බාධක මැඩ ගෙන සිනා නගමින් ඉදිරියට යන ගඟ අවට නිම්න භූමි සරු කරමින් නිල්ල වපුරයි. පිපාසිත මිනිසුන්ට හා සතුන්ට සිසිල් පැන් පොදක් සපයයි. එලෙස ගලා ය අතර සිය අත්දැකීම් වලින් ජීවිතය පෝෂණය කර ගනී. එ නිසාම ගංගාවේ ජීවන ගීතය ද අපට ආදර්ශයකි.

අප ගංගාවක් සේම උල්පත පසුකොට ගලා යායුතු ය. උල්පතක් වී එක තැන නතර වුවහොත් ජීවිතයේ සොඳුරු බව වින්දනය කළ නොහැකි වේ. අප අභියෝග භාරගෙන නොබියව ඉදිරියට යායුතු ය. ගඟකට වැවක් බවට පත් වී ස්වල්ප කාලයක් නතර වී අවට කෙත් බිම් සරු කරන්නට ද පුළුවන.

එය වියළි බිම සිසිල් කරවමින් රැඳී සිටියි. ගඟට නොනැවතී ගලන්නට මෙන්ම මොහොතක් නෙළුම් මල් යායක නතර වී සිනා සෙන්නට ද පුළුවන. එලෙසින් ජීවිතයේ සොඳුරු තැන් වල මොහොතක් නැවතී එහි ආශ්වාදය විඳින්නට ද අපට හැකි විය යුතුය.

වැවක් වී නතර වුණ දිය දහරට ගල් කැටයක් වැටුණු විට රැල් සිය දහසක් නැගුව ද ස්වල්ප වෙලාවකින් ඒ රැල් සිය දහස නොපෙනී ගොස් වැව නිසල වෙයි. රිදුමක් ඇති වූ විගස මහත් වේදනාවක් ගෙන දුන්න ද කල් ගත වන විට ඒ රිදුම් සාමාන්‍යකරණය වී සමනය වී යයි. එලෙසින් අප වෙත පැමිණෙන රිදුම් හමුවේ කාලයට ඉඩ හැර අප නිහඬව සිටිය යුතු නොවේ ද?

කාලය ගතවීමත් සමග නිල් දිය උනන උල්පත් සිඳී යා හැකිය. එහෙත් ගඟක් වී ගලන්නට ජීවය දුන් මව් කිරි උල්පත අපට සදානුස්මරණීයයි. මේ මව් කිරි උල්පත අප ශිල්ප ලැබූ පාසල , ගුරුවරුන් හෝ අපගේ දෙමව්පියන් විය හැක. අකුරට ඇවිදින් ශිල්ප ඥානය ලබා ගෙන පාසල නම් උල්පත පසු කොට ගඟක් මෙන් ගලා යන්නට දරුවනට පුළුවන.

ශිල්ප ඥානයත් ජීවිත පරිඥානයත් ලබා ගන්නා විට අප ගෙවන ජීවිතය කෙතරම් විශාල ද, මෙලොව කෙතරම් අප නොදුටු දෑ තිබේ ද යන්න වැටහෙයි. රත්න ශ්‍රී මේ ගීතයෙන් අමතන්නේ දරුවන්ය. ශිල්ප ඥානයත් ජීවිත පරිඥානයත් ලබා ගෙන ජීවිතයේ යථාර්ථයත් එහි පුළුල් බවත් දැකගන්නා ලෙෂ දරුවන්ට පවසයි. කෙටි කාලීන පැතුම් බිඳ වැටුණ ද ජීවිතය අත් නොහැර එහි උපරිම ස්ථානයට ගමන් කළ යුතු බවත් ගීතයෙන් කියවෙයි.

ආරියරත්න ඇතුගලයන්ගේ " රම්‍ය නගරය" ටෙලිනාට්‍ය උදෙසා රචනා වූ ගීතය ගයන්නේ ඉන්දිකා සමරසේකර විසිනි. ඇගේ හඬ ගඟක ගලා යන රිද්මයට මුසුව ගලා යයි. ආචාර්ය ප්‍රේමසිරි කේමදාසයන්ගේ තනුව හා සංගීතය ගීතයේ අරුතට අපූර්ව සෞන්දර්යක් මුසු කරවයි.

චාමිකා ජනානි ද සිල්වා

# සදාචාර සංවර්ධනය තුළින්
# කාන්තා අයිතීන් සුරකිමු

තුරුලතා මුදුන්හී දියත පුරා අනේක විධ වර්ණයෙන් හැඩයෙන් මෙන්ම සුගන්ධයෙන්ද විකසිත වන පුෂ්පයෝ මුළු ලොවම සුන්දර කරති. නෙත ගැටෙන ගැටෙන හැම දෙනාගේම සිත සනසාලන ඒ අනේක විධ පුෂ්ප සමූහයට ලොව පුරා වෙසෙන ස්ත්‍රී රත්නයන් උපමා කර ඇත .සැබවින්ම එය අඟනා උපමාවකි. කාන්තාව වූ කලී සැබවින්ම සුන්දරය. නිර්ව්‍යාජය. අවිහිංසකය. ඇය මුළු ලොවම සදන්නිය. නලවන්නීය. සුන්දර කරන්නීය. සතපවන්නීය. එසේ නම් ලොවක් වටිනා ස්ත්‍රිය ගැන කථා කරන්නට මාර්තු 08 වැනි දිනයක් යොදා ගැනීමද අතිශයින් වැදගත්ය. කාන්තාවකගේ පිහිටක්, උදව්වක්, උපකාරයක්, නොමැතිව මොළොව එළිය දකින, ජීවත්වන සත්වයෙක් නැත. කාන්තාවක් ලෙසින් ඉපදීම පාපකර්මයක් ලෙසත්, පිරිමියෙකු ලෙස ඉපදිම පුණ්‍ය කර්මයක් ලෙසත් දහම නොදන්නවුන් සලකන ලෝකයේ පුරුෂයාට උප්පත්තිය ලබා දෙන්නේද ගැහැණියයි. උපන් පසු ඔහු හදා වඩා ගන්නේද, මූලික අධ්‍යාපනය ලබා දෙන්නේද මව නැමති ගැහැණියයි. විවාහයෙන් පසු පිරිමියෙකුගේ මරණය දක්වා ඔහුගේ සියළු ඕනෑ එපාකම් සොයා බලා ඉටු කරන්නීද ගැහැණියකි. එසේ නම් ගැහැණියකගෙන් තොරව පුරුෂයෙකුට මෙලොව බිහිවීමටවත්, ජීවත් වීමටවත්, ජීවිතය එලදායි කරගැනීමටවත් නොහැකිය. සෑම සාර්ථක මිනිසෙකු පිටුපසම ගැහැණියක් ඇත." යනු ප්‍රසිද්ධ කියමනකි. එය සැබෑ සත්‍යකි. ලොව පවතින්නේ හිරුගේ රශ්මියෙනුත් මවගේ කිරිවලිනුත් " යන කියමනේ ගැඹුරු අර්ථයක් ඇත.

එහෙත් එවන්වූ ස්ත්‍රී රත්නයන් උපන්දා සිටම මියෙන තුරු අනේකවිධ දුක්ඛ දෝමනස්සයන් විදින්නේද ලොව පුරා වෙසෙන ශ්‍රේෂ්ඨ යැයි කියා ගන්නා ඇතැම් පුරුෂයන්ගෙන් වීම ඉතාම කණගාටු දායක කරුණකි. කාන්තාවන් තම ජීවිතයේ සෑම කාලයකදීම කවර හෝ පුරුෂයෙකුගේ ආදරය රැකවරණය පතන්නීය. සෑම කුඩා දියණියක්ම තම පියාගෙන් මෙන්ම සහෝදරයින්ගෙන් රැකවරණයක් ලැබෙන්නේ යැයි එකහෙලා විශ්වාස කරයි. එසේම තරුණියක් විවාහා වූ කළ සිය සැමියාගේ ආදරයත් රැකවරණයත් පතන්නීය.යම් දිනක සැමියා අහිමි වී වැඩිමහළු පුතණුවන් කෙනකු සිටින්නේ නම් ඔහුගේ රැකවරණය තමා මියෙන තුරුම පතන්නීය. එහෙත් වත්මන් සමාජය ගත් කළ ඇය පතන්නා වූ ආදරය රැකවරණය වෙනුවට ඇයට තම පියාගෙන්, සොහොයුරාගෙන්, සැමියාගෙන්



මෙන්ම තම කුසින් බිහිකොට හදාවඩා ගත්තා වූ පුතණුවන්ගෙන් පවා අනේක විධ දුක් කරදර විදින්නට සිදුව ඇත. එසේ වූ කළ සමාජයේ වෙසෙන අනෙකුත් පිටස්තරයන්ගෙන් ඇයට විදින්නට වන කරදර විපත් පිළිබඳව අසන්නට දෙයක් නැත.

> **"නීති පනවන්නෝද නීත් ක්‍රියාත්මක කරන්නෝද නීති පිළි නොපදිති. එවන් සමාජයක් තුළ කාන්තාවන්ට මෙවැනි දේ සිදු වීම පුදුම වන්නට කරුණක් නොවේ"**

පංච ශීලයට අදාළ දෑ පිඅළිබඳව විවිධ නීති රීති ඇත. නීති පනවන්නෝද නීති ක්‍රියාත්මක කරන්නෝද නීති පිළි නොපදිති. එවන් සමාජයක් තුළ කාන්තාවන්ට මෙවැනි දේ සිදු වීම පුදුම වන්නට කරුණක් නොවේ.

එහෙත් වත්මන් සමාජය තුළ අසන්නට, දකින්නට ලැබෙන්නේ මිනිසුන්ගේ රාගය අවුස්සන, වෛරය ඇති කරන. පළිගැනීම් වලට පොළඹවන, අනියම් සබඳතාවලට රුකුල් දෙන දේවල්ය. මල් සුවඳට ඇදෙන බඹරුන් සේ " මිනිසුන් ජනමාධ්‍ය, කටකතා ඔස්සේ එන මේ දේවල් වලට පෙළඹෙති. පන්සල, පල්ලිය, කොවිල ඇසුරු කරමින් සදාචාරාත්මක සංවර්ධනය කිරීමට නොයෙකුත් වැඩ සටහන් තිබුණද ඒ තුළින් තම ආධ්‍යාත්මය සංවර්ධනය කරගන්නේ අතළොස්සකි. කුඩා දරුවාගේ සිට වයෝවෘද්‍යා දක්වා බහුතරයක් සොයනුයේ මනස විකෘති කරගනිමින් තාවකාලික වින්දනයක් ලැබීමටය.

මෙවැනි වූ සමාජය තුළ කාන්තාවද විවිධාකරයෙන් පිරිහීමට පත්ව ඇත. උදාහරණයක් ලෙස ප්‍රකාශ කළහොත් පාසැල් වයසේ දියණියන් හැසිරෙන්නේ විවහායට සුදුසු තරුණියන් ලෙසය. දරුවන් සිටින මව්වරු තම ශ්‍රේෂ්ඨ මව් පදවිය පසෙකලා තරුණියන් මෙන් හැසිරෙමින් පුරුෂයන්ගේ සිත් දිනා ගැනීමට කටයුතු කරති. මිත්තනියන්ද තමන්ගේ තත්වය අමතක කර තරුණියන් සේ හැසිරෙමින් ගෞරවය නැති කර ගනිති. මෙවැනි අනිසි හැසිරීම් රටාව නිසා වත්මන් බාල, තරුණ, මහළු කාන්තාවන් විනාශ වී විවිධ අතවර වලටද ලක්වේ.

මෙසේ නොවී තම තමන්ගේ ගෞරවය ආරක්ෂා කරගෙන සිටින දැරියන්, තරුණියන්, මව්වරු, මිත්තණියන් නැතුවා නොවේ. එසේ සිටින කාන්තාවන්ගේ

සංස්කෘතිය බුදු දහමට අනුව හැඩගැසුන එකක් විය. ඒ සංස්කෘතිය තුළ වසර දහස් ගණනක් යන තුරාම කාන්තාවට අවශ්‍ය කරන ආරක්ෂාව රැකවරණය සමාජය තුළින් ලැබුණි. සියළු වස්ත්‍රාභරණයෙන් සැරසී රූමත් තරුණියකට ලංකාවේ දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා එනම් ලංකාවේ එක් කෙළවරක සිට අනෙක් කෙළවර දක්වා කිසිදු උවදුරකින් තොරව ගමන් කළ හැකි විය. එයට ප්‍රධානතම හේතුව වූයේ මිනිසා තුළ තිබුණු ආධ්‍යාත්මික ගුණවගාවත්, බෞද්ධ සංස්කෘතියත් නිසාය. බෞද්ධ සංස්කෘතියට අනුව සිය ආධ්‍යාත්මය සරු කරගත් ශ්‍රී ලාංකිකයා හැම විටම පන්සිල් සුරැකීම මෙයට හේතු විය. එබැවින් ඔවුන් අතින් ප්‍රාණගාතය, අදත්තාදානය, කාම මිත්‍යාචාරය සිදු නොවීය. තම බිරිඳ දරුවන්ට පමණක් නොව සතා සිව්පාවුන්ට වත් ඔවුන්ගෙන් කරදර විපත් සිදු නොවුණි. අන් සතු දෑ පැහැර ගැනීම, කම් සැප වැරදි ලෙස සිදු කිරීම, මහත් වූ පාපයක් බව ඔවුහු සැලකූහ. එබැවින් සියළු වස්ත්‍රාභරණයෙන් හෙබි රූමත් කත නිරුපද්‍රිතව හුදකලාව තම කාර්යයන් සඳහා නිදහසේ හැසිරුනි. අද බොහෝ පුරුෂයන් විසින් කාන්තාව බොරුවෙන් රවටනු ලබයි. එසේ සිදු කොට ඇයගෙන් තම කාමශාවන් ඉටුකරගනු ලබයි. එසේ සිදු කොට ඇය අතරමං කිරීම මෙන්ම මරණයටද පත් කරයි. එහෙත් නිසි පන්සිල් සුරැකි එදා සමාජය තුළ කිසිවෙකුත් මුසාවාද නොතෙපලාය. මදයට ප්‍රමාදයට පත් නොවුණි.

එහෙත් අද සමාජය හාත්පසින්ම වෙනස්ය. කොතෙක් බුදු බණ දෙසුවත්, කොතෙක් බුදු බණ කණ වැකුනත්, රාජ්‍ය පාලකයන්ගේ සිට සියළු දෙනාගේම පාහේ එකදු ශික්ෂා පදයක් වත් ආරක්ෂා කරන බවක් නොපෙනේ.

බෞද්ධ සංස්කෘතිය අගය කළ එදා සමාජයේ යුවතිය විවහාපත් වූයේ මව්පියන්ගේ ආශිර්වාදය සමඟය. එතෙක් ඇය කුමරි ඹබසර ආරක්ෂා කළාය. විවාහයෙන් පසු මියෙන තුරුම පතිදම් රැකීමද ශ්‍රේෂ්ඨ අයුරින්ම ඈ සිදු කළාය. සිය සැමියාට දෙවියෙකුට මෙන් ගරු කළ ඈ සැමියාගේ ගෞරවයද නිසි ලෙස රැක්කාය.

මෙසේ වාසය කළ පතිණියට ස්වාමි පුරුෂයා අඩම්තේට්ටම් කළේ නැත. ඇයට අසාධාරණය වන පරිදි කිසිදු අකටයුත්තක් ද නොකළේය.

මිහිපුර ධම්ම ප්‍රදීපා
භික්ෂුණීන් වහන්සේ

**දහම් සිතුවිල්ලක්...**

**සෙලො යථා එකඝනො - වාතෙන න සමීරති**
**එවං නින්දාපසංසාසු - න සමිඤ්ජන්ති පණ්ඩිතා**

**යම් සේ සිදුරු නැති ගල් පර්වතයක් සුළඟින් සෙලවිය නොහැක්කා සේ,එපරිද්දෙන් පණ්ඩිතයා වෙතට පැමිණෙන නින්දාවන්හිදීත්,සමාජයෙන් ලැබෙන ප්‍රශංසාවේදීත් යන දෙතැන්හිදීම කම්පාවට පත් නොවන්නේමය.**



# කලකට කට කෙතකට බැදි වැට සේමා කලකට කට පට මල්ලේ කට සේමා

මිහිරි කුරුළු ගී නදින් ලා හිරු රැස් කිරණින් උදාවන දවස මලානික හිරු කිරණින් උදාවන දවස මලානික හිරු කිරණින් අඳුරු වලාවන්ගෙන් නිමාවී යයි. අපි සැමදා මේ ගතකරන දිවියත් එසේම නොවේද? කුඩා දරුවකු ලෙස මෙලොව එළිය දකින අපි බාල තරුණ මහළු මේ අවධීන් පසු කරමින් මරණයෙන් ජීවිතය කෙළවර කරන්නෙමු. මෙය ලොව ඇති යථා ස්වභාවයයි.

සැම දෙනාට පොදු මේ නියත සත්‍ය පිළිබඳ අපට කතා කිරීමට සිව් පදයක් ලැබුණා. එම නිසාම මා කල්පනා කළා ඒ ලෝදම පිළිබඳව කතා කිරීම හොඳ යැයි කියා. අපේ සිංහල ජන කවියා මෙය ඉතා මැනවින් අවබෝධ කරගෙන තිබෙනවා. ඔවුන් බැස යන ඉර, පරවෙන මල් වැනි මේ සොබා දහමේ විපර්යාසයන්ගෙන් එය ලොවට පෙන්වා දීමට සමර්ථ වුණා.

මිනිසාට බාල, තරුණ, මහළු යනුවෙන් තුන් කාලයක්ම සිංහල ගැමියා මනා ලෙස අවබෝධ කරගෙන තිබෙන බව මා ඉහත මාතෘකාව ලෙස තෝරා ගත් දෙපදය අයත් කවියෙන් මනාව පැහැදිලි වෙනවා.

**කලකට කට මව් දෙතනේ කිරි බීමා**
**කලකට කට රස පලවැල වැලදීමා**
**කලකට කට කෙතකට බැදි වැට සේමා**
**කලකට කට පට මල්ලේ කට සේමා**

මෙය මා උපුටා ගත්තේ දහම් ගැට මාලාව නම් නව් පොතෙනි. එයට නිශ්චිත කතුවරයෙක් නැහැ. අපේ ජන කවි අතර තියෙනවා හුදකලා ජනකවි කියලා කොටසක්. ඒ අතරට වදන් කවි පොත, යශෝදරාවත, ගණදෙවි හැල්ල, වෙසතුරු දා කව වගේම දහම් ගැට මාලාවත් අයත් වෙනවා.

එදා ගැමියා දහම අවබෝධ කරගත්තේ සොබා දහමෙන් සහ එදිනෙදා කටයුතුවලිනි. දහම් ගැට මාලාවේ එන බොහොමයක් කවි එයට උදාහරණ සපයනවා.

අපට ලැබුණු මේ ජන කවියෙන්ද උපතේ සිට මරණය දක්වා යන ගමනේ විශේෂතා පෙන්වයි. එහි පළමු පදයෙන් පුද්ගලයාගේ බාල අවධිය පිළිබඳව සඳහන් කරයි. කලකට කට මව් දෙතනේ කිරි බීමා යනුවෙන් කවියා පුද්ගලයාගේ ළදරු අවදියේ මවගේ තුරුල්ලේ සිටින ආකාරය පෙන්වයි. මවගෙන් කිරි බොන්නේ බිලිඳු අවදියෙහිය. ළදරු වියෙන් පසුව ළමා කාලය පැමිණෙයි. ඒ කාලයේදී ළමයාගේ කටේ දත් වැඩෙයි.

එදා සිට රසවත් ආහාරපාන ගැනීමට පුද්ගලයා පුරුදු වෙයි. එයත් කට රස පලවැල වැළදීමා යනුවෙන් කවියා පෙන්වා දෙයි. ඒ ළමා කාලයයි. වැඩිහිටි කාලයේදී දත් ඉතා ශක්තිමත්ය. කෙතකට වැටක් බඳින්නේ එහි ආරක්ෂාවටයි. එය සවිමත්ය.

කවියා තුන්වෙනි පදයෙන් දත් පිළිබඳව පමණක් නොව මාහැඟි අන්දමට පුද්ගලයාගේ ශක්තිය බලය මෙන්ම තුරුණු වියේදී වැඩිහිටි වියේදි පුද්ගලයා සතුව ඇති වගකීම් යුතුකම් ගැනත් නොකියා කියයි.

කෙතකින් බොහෝ දේ කියවෙයි. පවුලක් රැක ගන්නට දේශයක් ජීවත් කරන්නට කෙතකින් බත සරි කළ යුතුවෙයි. පුද්ගල ජීවිතයේ මධ්‍යම අවධියේ ඇති වගකීම් සමුදාය මින් අදහස් වෙයි. එදා ගැමියාගේ ධනය බලය මැනීමට යොදා ගත්තේ කෙතයි. ගොවිතැන මුල් කරගෙන දිවිය ගොඩ නඟා ගත් සිංහල ගැමියාට කෙත අමතක කළ නොහැකි මෙන්ම මිල කළ නොහැකි මහාර්ඝ වස්තුවකි. ඒ නිසාම පුද්ගලයෙකුගේ මධ්‍යම අවදිය කෙත මෙන්ම පවුල් ජීවිතය සමඟ ද මනා සබඳතාවයක් ගොඩ නඟා ගන්නා අවධියකි. කවියා ඉහත දක්වූයේ ඒ සවිමත් භාවයයි.

ජීවිතය සැමදා එක ලෙස නොපවතී. සබ්බේ සංඛාරා අනිච්චාති යන බුදු වදනට අනුව සියලු සංස්කාරයන් අනිත්‍යයයි. ඒ අනිත්‍ය ස්වභාවය මේ ලොව සජීවි අජීවි සියලු දේ සතුව පවතින නියතතාවයකි. ටිකෙන් ටික සවිබල වියැකී ගොස් මිනිස් දිවියේ මහළු අවධිය උදාවෙයි.

කලකට කට පට මල්ලේ කට සේමා යනුවෙන් දක්වූයේ දත් වැටී, සම රැලි වැටී තිබෙන මුහුණකි. ලෝ සියලු දේට පොදු වූ වෙනස්වීම මිනිසාට උදා වීමේදී මදින් මද ලස්සන රුව අවලස්සන වීමට පටන් ගනී. පට මල්ල යනුවෙන් මෙහි සඳහන් කරන්නේ රෙදි වලින් සැදු බෑගයකි. එහි කට තිබෙන්නේ රෙදි වලින් නිසා හැකිලුනු ස්වභාවයකි. එයට මුව සමාන කරමින් කවියා දිවියේ අග භාගය මොනවට පැහැදිලි කරයි.

මේ අනුව ජීවිතයේ ඇති යථා ස්වභාවය ගැමියා සරල උදාහරණයන්ගෙන් තේරුම් ගැනීමට සලස්වා ඇති ආකාරය ඉතා සුන්දරය. හොඳට නරකට දෙකට කටමය කියා අප අසා ඇති වදනට අනුව කට සැම දෙයටම මුල් තැනක් ගනී. මහා විනාශයක් මෙන්ම ලොවටම සුවපත් කිරීමටද හැකියාව ලැබෙන්නේ කටින් කියැවෙන එක් වදනකටයි. එවන් කට ජීවිතයේ යථාර්තය ද පෙන්නුම් කිරීමට ගැමියා ඉතා සියුම්ව යොදාගෙන ඇති ආකාරය ඉතා විචිත්‍රවත්ය. බුදුදහම පිළිබඳව ගැමි ජනයා තුළ තිබූ අවබෝධයන් මින් මොනවට පැහැදිලි වෙයි.

ශාස්ත්‍රවේදී
එස්. දිල්රුක්ෂි අබේකෝන්

**විශ්‍රාමලත් සහකාර සංස්කෘතික අධ්‍යක්ෂ ඩී.එම්.එච්.කරුණාරත්න මහත්මාගේ අභාවයෙන් පසු උපහාර පිණිස පළ කෙරේ.**

# ගීත සම්ප්‍රදායේ පණ්ඩිත් අමරදේව් සළකුණ

කරන ලද,

***ගිලෙමි ඔබේ ගුණ මුදේ
වැඳිමි ඔබේ දම් සාදේ
වැඳිමි වැඳිමි ඔබ පාදේ
තිලොවග බුදු සමිඳේ***

***සිඳ බිඳ මොහඳුරු පාප -
දැල්වූ දහම් ප්‍රදීප
හෙළිකළ අප හෙළ දීප
තිලොවග බුදු සමිඳේ***

***සිල්ගත් දිනිඳුන් සේම සිල්
තෙද ගුණ ඇති සෝම
සතහට පෑ මවු පේම
තිලොවග බුදු සමිඳේ***

***දෙවියන් ගෙත් දෙව් සේක
බඹුන් හටත් බඹ හේන
ඔබ මැ අසම සම සේක
තිලොවග බුදු සමිඳේ***

යන ගීතය මාතර යුගයේ කිවිඳියන් බෙහෙවින් ප්‍රියකළ විරිත් රටාවකින් ලියවුණකි. මෙහිදී සාම්ප්‍රදායික විරිත් රටා තුළින් නව තනු නිර්මාණයට අමරදේවයන් දක්වන මහත් වූ අභිරුචිය කෙතරම් දැයි අනාවරණය වේ.

මහගමසේකර විසින් රන්සළු චිත්‍රපටයට රචනා කළ සිරිපා පියුමේ රොන්සුනු තැවරි යන ගීතය අමරදේවයන් විසින් සංගීතවත් කරන ලද්දේ සාම්ප්‍රදායික නාද රටා වලට අනුකූලව නව ශෛලියක පිහිටා සිටය. බෙර, තබ්ලා ආදී වාද්‍ය භාණ්ඩ කිසිවක් මෙම ගීතය සඳහා උපයෝගී කරගෙන නැත. මෙම ගීතය තුළින් අනුරාව නැගෙන්නේ සිරිපා වන්දනාවේ කරුණා කරන බැතිමතුන්ගේ මුවින් නැගෙන බුද්ධං සරණේ සිරස දරාගෙන යනාදී තුන් සරණේ කියමන් ලීලාවයි. නොඑසේ නම් පිරිත් දේශනා ශෛලියයි. මෙහි ශාන්ත රසය මැනවින් පිළිබිඹු වේ.

එසේම මහගම සේකරයන් රචනා කළ,

***ඇසේ මතුවන කඳුලු බිඳු
ගෙන ඔබේ සිරිපා දොවන්නම්
හදේ නැලවෙන කැලැමල්
ගෙන ඔබේ සිරිපා පුදන්නම්***

***කෙලෙස් මළ පිරි නුවර
අතහැර ඔබුන් වඩනට වරක්
වැඩි ඔබ
සොයා ආවෙමි පොලෝ
තලයේ
අනේ පිහිටක් නොමැති වූ
විට
ඉහල නිල්වන් අහස විනිවිද
නැගෙන ඔබගේ
යෝධ බුදු බැද
මගේ නෙත සිත මෝහණය
කර මගේ බුදුබව
පසක් කළ ඇත***

යනාදි බුදුගුණ ගීතය අමරදේවයන් ගායනා කලේ ස්වයං ස්වර නිර්මාණයෙන් ජන ගී රාවය උද්දීපනය වන පරිද්දෙනි.

දේශීය චිත්‍රපට කලාවට පසුබිම් ගීත හා අනිකුත් ගීත ගායනයෙන් අමරදේවයන් දක්වූ ප්‍රතිභාව ඉතාමත් ප්‍රශංසනීයයි. මේ සඳහා දියහැකි නිදසුන් බොහෝය. ඒ අතරින් පටාචාරා චිත්‍රපටයට අමරදේවයන් ගායනා කළ තණ්හා ආශා යන පසුබිම් ගීතය බුදුදහම සංරක්ෂිත ලෙස හුවා දැක්වූ ගීතයක් වූවාට කිසිදු සැකයක් නැත. සත්වයා භව සසරේ ගමන් කිරීමට හේතුවන තෘෂ්ණාව නිසා දුක, ශෝකය ඇතිවන බවත් නිර්වාණයට පත්වීමට නම් එය පහකළ යුතු බවත් මෙම ගීතයෙන් මනාව පෙන්නුම් කර ඇත.

ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ යනු ශ්‍රී ලංකාවාසින්ට බුදුරජාණන් වහන්සේ හා සමාන ශ්‍රද්ධා භක්තියක් දනවන පූජනීය වස්තුවකි. එම ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩ සිටින මහ මළුවේ සිට උන්වහන්සේ වන්දනාමාන කරමින් ගතකිරීමට භාග්‍යයක් නැතත් එය ලැබේවායි යන ප්‍රාර්ථනයෙන් හද පුරා ශ්‍රද්ධා භක්තියෙන් වෙළී සිටින බැතිමතෙකුගේ චිත්ත ස්වභාවය හෙළිකිරීමට පූජ්‍ය පල්ලේගම හේමරතන හිමියන් විසින් රචනා කරන ලද අමරදේවයන් ගායනා කරන,

***බෝධියෙන් වට
බෝපතක් සේ
සුමුදු වැලි මලුවේ
වැතිර ඉන්නට
වරම් මට කොහිදෝ***

***දුම්දු හෙවනේ සිහිල් පවනේ
නිවී සැනහී රැදී ඉන්නෙමි
සැලෙන බෝපත්
සැණින් මුමුණන
මියුරු බුදුගුණ සරින්
සැනැහේ***

***දුම්දු හෙවනේ සිහිල් පවනේ
නිවී සැනහී රැදී ඉන්නෙමි
ළැලූ බෝපත් තෙමා වැහෙන
පිදීවන් සැද දියෙන් නැහැවේ***

***දුම්දු හෙවනේ සිහිල් පවනේ
නිවී සැනහී රැදී ඉන්නෙමි***


යන ගීතයට හැකිවි ඇත. තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ උත්පත්තිය, බුද්ධත්වයට පත්වීම හා පිරිනිවන් පෑම යන අවස්ථා තුන සිදුවූ වෙසක් දිනය ලෝක බෞද්ධ ජනතාවට ආගමික වශයෙන් ඉතාමත් උතුම් දිනයකි. මෙම දිනයේ වැදගත්භාවය, ශාන්ත රසය හා බුද්ධාලම්භන ප්‍රිතිය දනවන අයුරින්, ''පාරමිතා බල පූජිත පූජිත බුද්ධ දිවාකරයාණෝ '' යන ගීතයෙන් අමරදේවයන් විසින් අර්ථාන්විතව ගායනා කොට ඇත.

2500 බුද්ධ ජයන්ති පූජෝත්සවය නිමිති කොටගෙන 1956දී අමරදේවයන් විසින් ගීත ගණනාවක් ස්වතන්ත්‍ර තනු නිර්මාණයෙන් ගායනා කරන ලදී. එම ගීත අතුරින්, පාතුර හෝසි බුද්ධ ජයන්ති යන ගීතය විශේෂ වූවකි.

ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහයන් විසින් රචිත මෙම ගීතයෙහි රීතිය අනික් ගීත වලට වඩා වෙනස්ය. පාලි භාෂාවෙන් ලියා ඇති මෙය පෙළබස නොදත් අයෙකු තුළ වුවද ශ්‍රද්ධා භක්තිය ජනනය කරවීමට සමත්වී ඇත. 1992 දී දඹදිව මූලගන්ධකුටි විහාර උත්සවයකදි අමරදේවයන් විසින් නිබන්ධ කරවා ගනු ලැබ නව තනුවක් මත ගයන ලද,

'' සාරානාථයෙ මිගදායේ බාරාණසියේ ඉසිපතනේ ධම්මචක්ක දේශනය පැවැත්වූ ගෞතම සම්බුදු සාක්‍යමුනී'' යන ගීතය සංකල්පීය විශ්ලේෂණයකට මං හෙළිකරයි. ධම්මචක්ක පවත්තන සූත්‍රය පිරිත් ශෛලිය අනුව දේශනා කරනවිට නැගෙන ධ්වනිරූප මාලාවේ භක්තිපූර්ව මධුරතාව මෙම ගීත ගායනය තුළින් රැව්පිළිරැව් නංවන්නේ බෞද්ධ සංස්කෘතියේ චිරන්තන නාද සංඝටණයක ස්වරූපයයි.

සමස්ථයක් වශයෙන් ගෙන සලකා බලන විට ආචාර්ය පණ්ඩිත් අමරදේව මහා ගාන්ධර්වයාණන්ගේ බෞද්ධ ගීත සරණිය බොදු පහන් සිත් භාවනාවට යොමු කරවන්නක් වනු ඇතැයි පෙන්වා දියහැක.



**ඩී.එම්.එච්. කරුණාරත්න
විශ්‍රාමලත් සහකාර සංස්කෘතික අධ්‍යක්ෂ, අලුවිහාරය
මාතලේ**

රංගිරි ශ්‍රී ලංකා
සත්‍ය ගවේෂී බෞද්ධ හඬ
රංගිරි ශ්‍රී ලංකා 2020 මාර්තු - 2563 මැදින් කලාපය

"ඉවසීමද කීකරු බවද ශ්‍රමණයන් දැකීමද සුදුසු කළ ධර්ම සාකච්ඡාවද උතුම් මඟුල්ය"

- මංගල සූත්‍රය -

# අස්ගිරි මහා විහාරයේ ගිමන් පන්සල වූ

## කුරුණෑගල ඇත්කඳ රජමහ විහාරය

ඇතුගල පාමුළ දෙවන (2) ක්‍රි.පූ. සියවසේ ආරම්භ වූ හත්ථිබවන්ධ විහාරය නිසා කඳු වැටියට පෞඪ ඓතිහාසික වටිනාකමක් හිමිවිය. වර්තමානයේ ඇත්කඳ රජමහා විහාරය නමින් හඳුන්වනු ලබන විහාරස්ථානයකි.

මහා වංශය, අනුරාධපුර යුගයට ගැනෙන රසවාහිනී සාහිත්‍ය කෘති වෙසෙසින් සඳහන් වන පරිදි රසවාහිනියේ චූලවග්ග හෙවත් සුළුගුළු වග කොටසෙහි මලියදේව මහ රහතන් වහන්සේ හා සුළුගුළු උපාසක අතර ඇති වූ ඓතිහාසික පුවත් කීපයකම කුරුණෑගල ඇත්කඳ රජමහ විහාරය ගැන සඳහන් වේ. මහාවංශ ඓතිහාසික වාර්තාවලට අනුව ඇත්කඳ රජමහ විහාරය පිළිබඳ තොරතුරු ලැබෙන්නේ දේවානම්පියතිස්ස රජ සමයෙනි.(ක්‍රි.පූ. 187-177) රජතුමා විසින් කරවන ලද විහාරයක් ලෙස ඇත්කඳ රජමහ විහාරය සඳහන් කර ඇත. වෙනත් ඓතිහාසික සාධක හෝ මූලාශ්‍ර වෙනත් ස්ථානයකින් හමුනොවී ඇති නිසා මහා වංශයේ ඇත්කඳ විහාරය යනුවෙන් සඳහන් කර ඇත්තේ මෙම කුරුණෑගල පිහිටි ඇත්කඳ විහාරයම බව තහවුරු වේ.



ලේඛකාධිකාරී ආනමඩුවේ
ශ්‍රී ධම්මදස්සී නායක හිමිපාණන් වහන්සේ

පළමුවන අග්බෝ රජතුමාගේ කාලයේ දී රජතුමා විසින් මෙහි ප්‍රාසාදයක් කරවන ලද බව මහා වංශයේ වාර්තා වේ. මේ අනුව පෙනී යන්නේ අනුරාධපුර යුගයේ සිටම ඇත්කඳ රජමහ විහාරය ශාසනික වශයෙන් ඉතා වැදගත් ස්ථානයක් වූ බවයි.

වයඹ පළාත යනු ශ්‍රී ලංකාවී ඉතා සුවිශේෂි ඓතිහාසික වැදගත්කමකින් යුක්ත පළාතකි. ඊට හේතුව වන්නේ දඹදෙණිය, යාපහුව හා කුරුණෑගල යන ප්‍රධාන රාජධානි තුනත් අයත් වීමය. ඇත්කඳ රජමහ විහාරයේ ආගමික ප්‍රබෝධය පැවුල වන්නේ කුරුණෑගල රාජධානි සමයේ හතරවන පරාක්‍රමබාහු රජතුමාගේ පාලන සමයේදීය. බෞද්ධයන් විසින් මහත් ගෞරව බහුමානයෙන් සජීවි පුරා වස්තුවක් ලෙස සළකන ජාතක කතා වහන්සේ සිංහලයට පරිවර්තනය වන්නේ හතරවන පරාක්‍රමබාහු රාජ්‍ය සමයේදීය. එහෙත් භික්ෂූන් වහන්සේලා මෙම පරිවර්ථනයට සම්බන්ධ වූ අතර දිඹුලාගල මේධාලංකාර හිමිපාණන් ජාතක කතා පොත භාරකරු වශයෙන් සිටිබව සඳහන් වේ. මෙම උතුම්බ කටයුත්ත ඇත්කඳ රජමහ විහාරයේ සිදු වූ බවට විශ්වාස කෙරේ. පැරණි ජාතක කතා පොත් වහන්සේ (මුලු කෘතිය) විහාරස්ථානයේ දැනටමත් සුරක්ෂිතව පවතින අතර වාර්ෂිකව පවත්වනු ලබන පෙරහැරකින් එය රැගෙන නගරයේ විදී සංචාරය කිරීම අද දක්වාම පවතින චාරිත්‍රයකි.

හතරවන පරාක්‍රමබාහු රජතුමාගේ රාජ්‍ය සමයේ සිදු වූ තවත් සුවිශේෂ සිදුවීමක් වනුයේ අස්ගිරි විහාර පාර්ශවය ආරම්භ වීමයි. අස්ගිරි තල්පත" මූලාශ්‍ර කරගෙන මහාචාර්යය මැන්දිස් රෝහණවීරයන් ශ්‍රී ලංකාවේ සංඝ සංවිධානය " ග්‍රන්ථයේ සඳහන් කරන අන්දමට යාපහුවේ සිට මහ පෙරහැරින් (1855 බු.ව) වෙසක් පොහෝ දිනට පෙර දින හත්ථිගිරි විහාරයට වැඩමවා එක්රැයක් පහන් කොට පසුදා එතැන් සිට මහ පෙරහැරින් සෙංගඩගල නව සේනාසනයට වැඩම කරවූ බව සඳහන් වේ. මෙම වසරට එනම් 2012 මැයිමස වන විට වසර හත්සියයක් 700ක් සම්පූර්ණ වන අස්ගිරි විහාරය ආරම්භ වූයේ ඇත්කඳ මහ විහාරයේ සෙනසුන් පහසුකම් ලබමින් වැඩම කළ භික්ෂූන් වහන්සේලාගෙනි. අදටත් අස්ගිරි මහා විහාරයේ ගමන් පන්සල ලෙස සැළකෙන්නේ ඇත්කඳ රජමහ විහාරයයි. කුරුණෑගල රාජධානි සමයේ ශ්‍රී ධන්ත ධාතූන් වහන්සේගේ තේවාව භාර වී ඇත්තේ ඇත්කඳ විහාරයේ වැඩසිටි භික්ෂූන් වහන්සේම බව විශ්වාස කෙරේ. නටඹුන් වී ඉතිරි වී තිබෙන රාජමාළිගාව දළදා මාළිගාව රජ නෑමට භාවිතා කළ රජ පිහිල්ල හා ඇත්කඳ රජමහා විහාරය යන පෞරාණික ස්ථාන පිහිටා ඇත.

ඇත්කඳ රජ මහ විහාරයේ ඉපැරණි ලෙන් විහාර දෙකක් පවතී. මෙම ලෙන් විහාර විටින් විට ප්‍රතිසංස්කරණයට භාජනය වූ ඒවා බව සුපරීක්ෂාකාරීව නිරීක්ෂණය කිරීමෙන් පෙනී යයි. එහෙත් පළමු ලෙන් විහාරය සූරතිස්ස රජතුමා විසින් ඉදිකර ඇති විහාර ගෙය ලෙස සඳහන් වේ. ලෙන් විහාරයේ ඇති ගල් පිළිම වහන්සේ (සෙල් මුවා) පසු කලෙක හුණු බදාම යොදා සිවුරේ රැළි සකසා ඇත. මෙම සෙල් මුවා පිළිම වහන්සේ අනුරාධපුර යුගයට අයත්දැයි සැළකේ. පිළිම ගෙය තුළ සැතපෙන පැතපෙන බුදු පිළිමය, සමාධි පිළිම තුනක් හා හිටි පිළිමයක් දක්නට ලැබේ. ඊට යාබඳව අනෙක් ලෙන් විහාරයේ සත්සතිය නිරූපණය කිරීමට උත්සහා දරා ඇත. මෙම විහාර ගෙවල් නුවර යුගයේ මැද භාගයේ ප්‍රතිසංස්කරණයට ලක්වන්නට ඇතැයි සිතිය හැක.

විහාර භූමියේ පිහිටා ඇති ගලේ බණ්ඩාර දේවාලය ප්‍රදේශවාසින්ගේ මහත් භක්තියට හා විශ්වාසයට පත් ස්ථානයකි. මෙයට අධිගෘහිත දෙවියන් ලෙස සැළකෙන්නේ කුරුණෑගල පළමුවන රජුයැයි සැළකෙන දෙවන බුවනෙකබාහු (1293-1303) රජුට දාව යොත් ලියක කුස උපන් වත්හිමි බණ්ඩාරයන්ය.

ඇත්කඳ රජමහ විහාරය කුරුණෑගල නගරයේ ඉපැරණිතම බෞද්ධ මධ්‍යස්ථානයකි. ඉතා මෑත කාලයේ සිදු වූ යම් යම් දුර්වලතා නිසා ඓතිහාසික වටිනාකමකින් යුත් විහාරස්ථානය විවිධ අඩුපාඩුකම් මධ්‍යයේ පවති. වර්තමානයේ විහාරයේ භාරකාරත්වය හා නායකත්වය උසුලන අස්ගිරි මහා විහාර පාර්ශවයේ ලේඛකාධිකාරී ආනමඩුවේ ශ්‍රී ධම්මදස්සී නායක හිමිපාණන් වහන්සේ යටතේ ගොඩ නැගෙන ඇත්කඳ රජමහා විහාරය කුරුණෑගල නගරවාසී ජනතාවට මෙන්ම ලංකාවාසී සියළු බෞද්ධ ජනතාවට මහත් අස්වැසිල්ලක් වන්නේ විහාරස්ථානය තුළින් ඇතිවී ඇති නව බෞද්ධ පුනර්ජීවය නිසාය.


හේමන්ත බණ්ඩාර හේරත්
විල්බාව ශ්‍රී පත්තිනි දේවාලයේ
හිටපු බස්නායක නිළමේ.



විහාර සිතුවම්



සඳකඩ පහන සහිත පඩිපෙළ



නුවර යුගයේ ලී කැටයම් සහිත උළුවස්ස



වාමන රූපයක්



ලී කැටයම් සහිත උළු වස්ස